සීමාසහිත සී-නෝර් පදනම.




# 2014
# වාර්ෂික වාර්තාව

**සීමාසහිත සී-නෝර් පදනම.**

අංක. 335, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10, ශ්‍රී ලංකා.

# පටුන


| | | |
|---|---|---|
| **01.** | සංයුක්ත තොරතුරු | 02 |
| **02.** | දැක්ම, මෙහෙවර සහ අරමුණු | 03 |
| **03.** | සමාගමේ ඉතිහාසය | 04 |
| **04.** | අධ්‍යක්ෂක වාර්ථාව | 06 |
| **05.** | සභාපතිතුමාගේ සමාලෝචනය | 08 |
| **06.** | වසරේ ලැබූ ජයග්‍රහන | 11 |
| **07.** | මූල්‍ය ක්‍රියාකාරීත්වය, වත්මන් කටයුතු සහ ඉදිරි සැලසුම් | 15 |
| **08.** | විගණන වාර්ථාව | 18 |
| **09.** | සමස්ථ ආදායම පිළිබඳ ප්‍රකාශනය | 19 |
| **10.** | මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශකය | 20 |
| **11.** | ව්‍යාපාර වස්තු අගයන්හි වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය | 21 |
| **12.** | මුදල් සංචරණය පිළිබඳ ප්‍රකාශනය | 22 |
| **13.** | මූල්‍ය ප්‍රකාශන වලට සටහන් | 23 |
| **14.** | සමස්ථ ආදායම් ප්‍රකාශනයට සටහන් | 34 |
| **15.** | විගණන වාර්ථාව පිළිබඳ අදහස් | 38 |

# සංයුක්ත තොරතුරු.

| | | |
|---|---|---|
| සමාගමේ නම | : | සීමාසහිත සීනෝර් පදනම. |
| නෛතික ආකෘතිය | : | 1982 අංක 17 දරණ සමාගමේ සමාගම් පණත යටතේ සහ ඉන් පසුව 2007 අංක 07 දරණ සමාගම් පණත යටතේ ශ්‍රී ලංකාව තුළ සංස්ථාපනය නොලද සීමිත වගකීම් සහිත සමාගමකි. |
| ලියාපදිංචි ලිපිනය | : | 335.ඩී.ආර්. විජයවර්ධන මාවත, කොළඹ 10. |
| අධ්‍යක්ෂක මණ්ඩලය | : | බී.වී.සරත් කුමාර ද සිල්වා මහතා 2010.05.20 වන දින අධ්‍යක්ෂක හා සභාපති ලෙස පත් කරන ලදී.<br><br>කේ. උපිත් අනුරාධ මහතා 2010.05.20 වන දින අධ්‍යක්ෂක සහ කළමණාකාර අධ්‍යක්ෂක ලෙස පත් කරන ලදී.<br><br>පී.ඒ.එස්. අතුල කුමාර මහතා 2010.06.23 වන දින අධ්‍යක්ෂක හා භාණ්ඩාගාර නියෝජිත ලෙස පත් කරන ලදී.<br><br>ජී.ඩී. ගුණදාස මහතා 2010.08.25 වන දින අධ්‍යක්ෂක ලෙස පත් කරන ලදී.<br><br>එම්.එෆ්.කේ. ශයිරාස් 2010.08.25 වන දින අධ්‍යක්ෂක ලෙස පත් කරන ලදී. |
| සමාගම් ලේකම් | : | සීමාසහිත A & A Associates (Pvt) Ltd සමාගම |
| විගණකවරු | : | ගුණසේකර තේනායක සහ සමාගම වරලත් ගණකාධිකාරී 65/3, චිත්තම්පලම් ඒ.ගාඩිනර් මාවත, කොළඹ 02. |
| බැංකුකරුවන් | : | ලංකා බැංකුව<br>හැටන් නැෂනල් බැංකුව<br>මහජන බැංකුව<br>පෑන් ඒෂියා බැංකුව |
| කර්මාන්තශාලා | : | මට්ටක්කුලිය නැව් තටාංගනය<br>බේරුවල නැව් තටාංගනය (යෝජිත)<br>කරෙයි නගර් නැව් තටාංගනය (යෝජිත) |
| වෙනත් ව්‍යාපෘති | : | cey-nor orient seafood restaurant<br>(කළමණාකරන ගිවිසුමක් මත ක්‍රියාත්මක වේ.)<br><br>මෝටර් රථ වැඩපල<br>(කළමණාකරණ ගිවිසුමක මත ක්‍රියාත්මක වේ.) |

**අපගේ දැක්ම -**

ධීවර සහ විනෝද යාත්‍රා නිපදවීම සහ මාළු දැල් සහ ධීවර ආම්පන්න ශ්‍රී ලංකාව තුළ සැපයීම තුළින් වෙළඳපොල ප්‍රමුඛයෙකු වීම සහ ජාත්‍යන්තරව පිළිගත් බෝට්ටු නිෂ්පාදකයෙකු වීම හා අක් වෙරළ සැලසුම් ක්ෂේත්‍රයේ ප්‍රමුඛයෙකු වීම සහ ශ්‍රී ලංකාව තුළ ඉදිකිරීම් කටයුතු සිදුකිරීම.

**අපගේ මෙහෙවර-**

තරංගකාරී මිළගණන් යටතේ ඉහළ ප්‍රමිතියෙන් යුතු ධීවර යාත්‍රා සහ ධීවර ආම්පන්න සපයන කාර්යක්ෂම හා පළදායි රජයේ ආයතනයක් ලෙස කටයුතු කිරීම.

අක් වෙරළ සහ වෙරළ ආශ්‍රිත ඉදිකිරීම් සේවා සැපයීම.

**අපගේ අරමුණු -**

- ❖ ෆයිබර් ග්ලාස් බෝට්ටු අපනයනයේ පිළිගත් අපනයනකරු බවට පත්වීම.
- ❖ ජාත්‍යාන්තරයේ කීර්තිමත් ෆයිබර් ග්ලාස් බෝට්ටු නිෂ්පාදකයෙකු බවට පත්වීම.
- ❖ විදේශ රටවල් තුළ ෆයිබර් ග්ලාස් බෝට්ටු නිෂ්පාදනයේ ආයෝජිතයෙකු බවට පත් වීම.
- ❖ ධීවර බෝට්ටු සහ ධීවර ආම්පන්න වැනි අනර්ඝ තත්වයේ නිෂ්පාදන සැපයීම තුළින් ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තය සංවර්ධනය කිරීමේ වඩාත් පළදායී අනුග්‍රහයෙකු වීම.
- ❖ විශිෂ්ඨ පාරිභෝගික සේවා සැපයන්නෙකු වීම.
- ❖ ධීවර කර්මාන්තය සඳහා අවශ්‍ය වන අක් වෙරළ සහ වෙරළ ඉදිකිරීම් කටයුතු සිදු කිරීම.

## සමාගමේ ඉතිහාසය.

1987 අංක 23 දරණ පොදු සමාගම් යටතට ගැනෙන රාජ්‍ය සංස්ථා සහ රාජ්‍ය හිමිකාරිත්වය දරණ ව්‍යාපාර පිළිබඳ වූ සම්මුතිය යටතේ රජය සතු ව්‍යාපාර සීමා සහිත සීනොර් පදනම යටතට ගෙන එම ව්‍යාපාර පවත්වාගෙන යාම සහ පවරා ගැනීමටත් 1990 ජනවාරි 17 වන දින පොදු වගකීම් සහිත සමාගමක් ලෙස සීමාසහිත සීනෝර් පදනම සංස්ථාපනය කරන ලදී.

දේශීය ධීවර ප්‍රජාවගේ අධ්‍යාපනය සහ සුභසාධනය ඉහළ නැංවීම සඳහා ලාබ නොලබන සංවිධානයන් ලෙස 1968 දී සීනෝර් සංවර්ධන පදනමේ සිය කටයුතු ආරම්භ කරන ලදී.

සහන සාරාංශ කර දක්වා ඇති පරිදි මෙම සංවිධානය අවුරුදු ගණනාවක සිට විවිධ වෙනස්කම් කිහිපයකට භාජනය වී ඇත.

**1967** නෝවේවියානු රාජ්‍ය නොවන සංවිධානයක් වන Norges Godtemplarunngdoms Forbund Cnaui යන ආයතනයෙන් ලැබුනු ආධාර භාවිතා කොට සීනෙනෝර් සංවර්ධන පදනම ආරම්භ කර මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලදී.

**1971** 1983 අංක 51 දරණ සමාගම් ආඥා පණත යටතට ඇපකරුවෙකු මගින් සීමාසහිත පොදු සමාගමක් ලෙස සංස්ථාපනය කරන ලද අතර, හා සීමාසහිත සීනෝර් සංවර්ධන පදනම වශයෙන් හඳුන්වන ලදී.

**1985** අංක 38 දරණ ව්‍යාපාර අත්පත් කර ගැනීමේ පණත යටතේ ශ්‍රී ලංකා රජයට අත්පත් කර ගන්නා ලද අතර, සීමා සහිත සීනෝර් සංවර්ධන පදනමේ GOBU බවට පත් විය.

**1990** 1987 අංක 23 දරණ රාජ්‍ය හිමිකාරිත්වයක් දරණ ව්‍යාපාරික ඒකක සමාගම් පනත නැතහොත් රාජ්‍ය සංස්ථා බවට පත් කිරීම යොදා ගැනීමත් සමගම සීනෝර් සංවර්ධන පදනමේ රා.හි.ද. (GOBU) ව්‍යාවස්ථා එ කටයුතු නතර විය.

**සීමා සහිත සී-නෝර් සංවර්ධන පදනමෙහි පූර්වයෙන්** වූ (GOBU) රාජ්‍ය හිමිකාරිත්වයක් සහිත ව්‍යාපාරික ඒකක සාර්ථක කර ගැනීමෙහි ලා සීමා සහිත සීනෝර් පදනම 1982 අංක 17 දරණ සමාගම් පණත යටතේ ස්ථාපිත කරන ලදී.

මෙම නව සමාගෙමේ සම්පූර්ණ කොටස් ප්‍රාග්ධනය වන රුපියල් (40,000,000.00) මුදල භාණ්ඩාගාර ලේකම් වෙත ලබා දී ඇත.

**2011** අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සහිතව රජය විසින් ගන්නා ලද ප්‍රතිපත්තිමය තීරණයකට අනුව සීමා සහිත සීනෝර් පදනම යටතේ පැවැති ලුණුවිල සහ වීරවිල මාළුදැල් කර්මාන්ත ශාලා දෙක 2011 නොවැම්බර් මස 01 වන දා සිට ක්‍රියාත්මක වන පරිදි සාම්ප්‍රදායික කර්මානත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යංශය යටතේ පවත්වාගෙන යෑම සඳහා සීමාසහිත නෝර්ත් සී ආයතනයට පවරා දෙන ලදී.

සීමාසහිත සීනෝර් පදනම සහ සීමාසහිත නෝර්ත් සී ආයතනය අතර, ඇති කර ගත් අවබෝධතා ගිවිසුම අනුව, බීරවිල සහ ලුණුවිල කර්මාන්ත ශාලා වන නිශ්පාදිත මාළු දැල් අලවියේ එකම අලෙවි නියෝජිත ලෙස සී නෝර් පදනමට අනුමැතිය පවරා ඇත.

**2014** ශ්‍රී ලංකාව තුළ ඉදිකිරීම් තටයුතු සහ අක් වෙරළ සැලසුම් ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා වීමේ අපේක්ෂාවෙන් යුක්තව අක් වෙරළ සහ වෙරළ ආශ්‍රිත ඉදිකිරීම් සේවා ලබා දීම ආරම්භ කරන ලදී.

**2014 දෙසැම්බර් 31 අවසන් වන වර්ෂය සඳහා**
**වන අධ්‍යක්ෂක වාර්ථාව :-**

**01. විගණනනය කරන ලද ගිණුම්**
2014 දෙසැම්බර් 31 වසර අවසානය සඳහා

**02. මූල්‍ය ප්‍රතිඵල**
වර්ෂය සඳහා වන ශුද්ධ ලාභය / පාඩුව පිටු අංක 19 හි සමස්ථ ආදායම පිළිබඳ ප්‍රකාශනයේ දක්වා ඇත.

**03. පවත්නා තත්වය**
සමාගමේ පවත්නා තත්වය පිටු අංක 20 හි දක්වා ඇත.

**04. ප්‍රධාන ක්‍රියාකාකම්**
ඉකුත් මූල්‍ය වර්ෂයේ සිට නොවෙනස්ව පැවැති සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් පහත පරිදි වේ.
ෆයිබර් යාත්‍රා සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන නිපදවීම සහ අලෙවිය.
ශ්‍රී ලංකාව තුළ නයිලෝන් මාළු දැල් සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන වල එකම බෙදාහරින්නා වශයෙන් කටයුතු කිරීම.
ධීවර යාත්‍රා, නාවික යාත්‍රා එන්ජින්, නාවික සහ ධීවර ආම්පන්න අළුත් වැඩියා කටයුතු සඳහා වැඩමුළු පැවැත්වීම.
මීට අමතරව 2012 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන පරිදි පහත සඳහන් ක්‍රියාකාරකම් හඳුන්වා දෙන ලදී.
සියළුම වර්ගයේ මුහුදු යාත්‍රා සැලසුම් කිරීම.
සිවිල් ඉදිකිරීම් කටයුතු වල නියැලීම සහ පවත්නා තටාංගන පහසුකම් ජ්‍යාත්‍යාන්තර මට්ටමට ගෙන ඒම සඳහා ඒවා වැඩි දියුණු කිරීමේ කටයුතු වල නියැලීම.
අක්වෙරළ ඉදිරිකිරීම් කටයුතු වල නැයැලීම.

**05. ලාභාංශ**
2014 වර්ෂය සඳහා ප්‍රකාශිත ලාභාංශ අධ්‍යක්ෂකවරු අනුමත නොකරන ලදී.

**06. සමාගම සමග යෝජිත කොන්ත්‍රාත්තු හා ඒ පිළිබඳ අධ්‍යක්ෂකවරුන්ගේ උනන්දුව.**
මෙම කාල පරිච්ඡේදය තුළ කිසිදු අධ්‍යක්ෂකවරයෙකු සමාගම සමඟ ගිවිස ගැනිම් සඳහා උනන්දුවක් නොදක්වන ලදි.

**07. සමාගමේ කොටස් පිළිබඳ අධ්‍යක්ෂකවරුන්ගේ උනන්දුව.**
2014 දෙසැම්බර් මස 31 දක්වා වූ වසර අවසාන කාලය තුල කිසිදු අධ්‍යක්ෂකවරයෙකු විසින්

**08. ප්‍රධාන කොටස් හිමිකම්.**

ශේෂ පත්‍ර දිනට, සමාගම විසින් නිකුත් කරන ලද කොටස් වලින් 100%ක් භාණ්ඩාගාර ලේකම් සතුව පවතී.

**09. පුණ්‍යාධාර.**

පුණ්‍යමය කටයුතු සඳහා හෝ දේශපාලන අරමුණු සදහා මෙම වර්ශය තුලදී කිසිදු දායක වීමක් සමාගම විසින් සිදු නොකරන ලදී.

**10. යන්ත්‍රෝපකරණ සහ අනෙකුත් බඩු බාහිර ආදිය වෙනත් ස්ථානයකට ගෙන යාම.**

දේපල, යන්ත්‍රෝපකරණ සහ බඩුබාහිර ආදිය වෙනත් ස්ථානයකට රැගෙන යාම පිළිබඳව පිටු අංක 33 ඇති ලේඛනයේ දක්වා ඇත.

**11. බැංකු පහසුකම්.**

වර්ෂය අවසානය තෙක් බැංකු පහසුකම් ලබා දීමට කාලය දීර්ඝ කල සමාගමේ බැංකුකරුවන් හට තවදුරටත් එම සේවය ලබා දීම පිළිබඳ අධ්‍යක්ෂකවරුන් තෘප්තිමත්ව ඇත.

**12. විගණකවරුන්පත් කිරීම.**

විගණකාධිපති විසින් ගුණසේකර තේනායක සහ සමාගම (වරගත් ගණකාධිකාරී) නම් කරනු ලැබූ අතර, මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාවසාය දෙපාර්තුමේන්තුව විසින් අනුමත කරන අතර, සීමා සහිත සී නෝර් පදනමෙහි 23 වන වාර්ෂික මහා සභා රැස්වීමේදී සමාගම් විගණකාධිවරුන් වශයෙන් පත් කරන ලදී.

**13. 2014 දෙසැම්බර් 31 දිනට සමාගමේ අධ්‍යක්ෂකවරු.**

| | | |
|---|---|---|
| බී.පී.සරත් කුමාර ද සිල්වා මහතා | : | සභාපති (2014.12.22 දක්වා) |
| කේ. උපීත් අනුරාධ මහතා | : | කළමණාකාර අධ්‍යක්ෂ (2014.12.22 දක්වා) |
| ජේ.ඩී. වාලිගමගේ මිය | : | භාණ්ඩාගාර නියෝජිත |
| ජී.ඩී. ගුණදාස මහතා | : | අධ්‍යක්ෂක |
| එම්.එෆ්.කේ. ෆයිරුස් මහතා | : | අධ්‍යක්ෂක |
| ඩබ්.ඒ.ටී. වීරසිංහ | : | අධ්‍යක්ෂක |

මණ්ඩලයේ නියමය ප්‍රකාරව,

අත්සන් කලේ,
**ඉංජිනේරු බී.වී.සරත් කුමාර ද සිල්වා**
සභාපති

අත්සන් කලේ,
**සීමාසහිත ඒ ඇන්ඩ් ඒ ඇසෝසියේට් (පුද්.) සමාගම**
සමාගම් ලේකම්

## සභාපතිතුමාගේ සමාලෝචන වාර්තාව.

**2014 දෙසැම්බර් මස 31 න් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා වන සීමාසහිත සී-නෝර් පදනමේ වාර්ෂික වාර්තාව අමාත්‍ය මණ්ඩලය වෙත පිරිනමන්නේ ඉමහත් සතුටිනි.**

2014 දෙසැම්බර් මාසයේ ඉතා කෙටි කාල පරිච්ඡේදයක් හැරුණු කොට 2010 ජූනි මස සිට සීමාසහිත සීනෝර් පදනමෙහි සභාපති වශයෙන් මම සේවය කරමි.

ආරම්භයේදී සමාගමට විවිධ පාඩු විඩ දරා ගැනීමට සිදු වුවද පසුව සිදු කරන ලද මෙහෙයුම් කටයුතු වල නව ව්‍යාපෘතිය සමඟ පසුගිය වසර 05 ක කාලය තුළ එම තත්වය සම්පූර්ණ වෙනසකට භාජනය විය. 2013 වර්ෂයේදී සමාගම ආන්තික ප්‍රතිලාභයක් හිමිකර ගත් අතර, 2014 වර්ෂයේදී සීඝ්‍ර වර්ධනයක් සමඟින් රුපියල් මිලියන 89 ක සැලකිය යුතු ප්‍රතිලාභයක් වාර්තා කරන ලදී.

| ශුද්ධ ලාභය (පාඩුව) බදු පැනවූ පසු | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 |
|---|---|---|---|---|---|---|---|---|
| | (24.6) | (25.8) | (30.3) | (23.5) | (16.2) | (7.1) | .070 | 89.4 |

පහත වගුවෙහි දැක්වෙන ආකාරයට එය ඉහල මට්ටමකට ලගා වී ඇත. මෙම කාල සීමාව තුලදී වාර්ෂිකව ඉහළ පොලියක් ගෙවමින් සිටි රුපියල් මිලියන 30 ක් පමණ වූ බැංකු ණය ගෙවා නිම කිරීමට සීනෝර් පදනමට හැකි විය. ලංකා බැංකුවෙන් ලබා ගත් කෙටි කාලීන ණය මුදලට ඉතිරිව පැවැති රුපියල් මිලියන 13.9 ක් සමත වූ මුදලක් ද 2014 වසරේදී ගෙවා නිම කිරීමට හැකි විය. ඉකුත් අවුරුදු වල සමාගම බැංකු අයිරා මත සිය කටයුතු පවත්වා ගෙන ගිය මුත් වර්තමානයේ මුදල් භාවිත මත මෙහෙයුම් කටයුතු සිදු කරයි. රුපියල් මිලියන 6.5 ක් සමත වූ 2010 වර්ෂයට පෙර දින පසුව හිඟ බදු මුදල්ද මෙම වසර තුළදී ගෙවා නිම කිරීමට හැකි විය.

| විස්තරය | 2009.12.31 දිනට ශේෂය | 2014.12.31 දිනට ශේෂය |
|---|---|---|
| | 36,747,698.17 | - |
| බැංකු අයිරා | 409,434.90 | - |
| සමුච්චිත ලාභය | (84,926,452.96) | (42,251,505.62) |
| හිඟ වැටුප් | 6,296,663.15 | - |
| වත්කම් | 198.72mm | 445.25mm |

සමාගම විසින් මෙම කාලපරිච්ඡේදය තුළ උපයාගත් ආදායමින් විශාල කොටසක් ගෙවීමට සිදු වූ ඉහත දක්වා ඇති ණය ගෙවීම් පියවීම සහ වඩාත් කාර්‍යක්ෂම ආකාරයකින් මෙහෙයුම් කටයුතු සිදු කිරීම. 2014 වර්ෂය තුළ සමාගම සුවිශේෂි ප්‍රතිලාභ අත්කර ගැනීමට හේතුව වශයෙන් හඳුනාගෙන ඇත. එමෙන්ම අත්‍යවශ්‍ය සහ කුසලතා සහිත අවම සේවක මණ්ඩලයක් භාවිතා කිරීමටද සංවිධානයෙන් මෙම සැලකිය යුතු ප්‍රතිලාභ ලබා ගැනීමට හේතු වී ඇත.

හිඟ වැටුප් වශයෙන් සේවකයන්ට ගෙවීමට තිබූ රුපියල් මිලියන 5 ට ආසන්න මුදලක් එම වසර තුළ මුදල් අතිරික්තයක් ද සමඟ ගෙවා දැමීමට සමාගමට හැකි විය. ඉහළ ලාභයන් අත්පත් කර ගැනීමත් සමඟ 2014 වසර සඳහා සමස්ථ කාර්යය මණ්ඩලය සඳහා එක් මසක වැටුප ප්‍රසාද දීමනාවන් වශයෙන් ලබා දෙන ලදි.

ඉතා විශාල පාඩු ලබන ආයතනයක්ව තිබූ සමාගම ඒ තත්වයෙන් මෙම කාල සීමාව තුළ මුදවා ගනු ලැබුවද රුපියල් මිලියන 135 ක් පැවත වූ ඉහත සඳහන් කරන ලද ව්‍යාපෘති වල කාර්යයන් සම්පූර්ණ කිරීම මත සමාගමේ මූල්‍ය ගැලීම් පිළිබඳ ගැටලු වලට එම තත්වය තවමත් බලපෑම් ඇති කරයි.

කරුණාකර පිටු අංක 19 හි මූල්‍ය වාර්ථා බලන්න.

සමාගමට විශාල ආදායමක් උපායා ගැනීමට දායක වූ ලුණුවිල හා වීරවිල පිනහිටි මාළු දැල් කර්මාන්තශාලා 2 ක අමාත්‍ය මණ්ඩල තීරණයන් මත සාම්ප්‍රධායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යංශය යටතේ ක්‍රියාත්මක බවත් රාජ්‍ය ආයතනයක් වන සීමාසහිත නෝර්ත් සී ආයතනයට පවරා දී තිබියදී සමාගම 2014 වසරේ ඉහළ සාර්ථකත්වයක් අත්පත් කර ගැනීම ද මෙහිදී සඳහන් කිරීම වැදගත් වේ.

සීනෝ(ර්) පදනමෙහි ලාභ ඉපැයීම පිළිබඳ අවධානයට යොමු කරන විට සැලකිල්ලට භාජනය කල යුතු බවත් එකී වැදගත් කරුණක් වන්නේ 2014 නොවැම්බර් මස සිට ක්‍රියාත්මක වන පරිදි සේවකයින්ගේ වැටුප්වල නීත්‍යානුකූල වර්ධනයක් සිදු කර තිබියදීත් ඉහත ප්‍රතිලාභ අත්පත් කර ගැනීමට හැකිවීමයි.

අධීක්ෂණය යටතේ මෙම වසර තුළ සිදු කරන ලද බෝට්ටු සැකසීම හා විකිණීම පිළිබඳ කටයුතු මෙම වාර්ථාවේ කිසියම් තැනක දක්වා ඇත. 2014 වසර තුළ රුපියල් මිලියන 70 ක් පමණ වටිනා ගොඩබෑමේ මධ්‍යස්ථානයක් සීනෝ(ර්) පදනම මඟින් සැලසුම් කර ගත් කාලයට මාස 4 කට පෙර දික් වූ විට ප්‍රදේශයේ සදා නිම කරන ලද අතර, තවත් ගොඩබෑමේ මධ්‍යස්ථානයන් මරදාන (බේරුවල) ඉදිකරණ ලදී. එහි ව්‍යාපෘති වටිනාකම රුපියල් මිලියන 240 කි. මෙය 2015 වසරේ අවසන් කිරීමට අපේක්ෂිතව තිබූ අතර, නැවතත් යෝජිත කාලයට පෙර එනම්, 2014 අවසාන වන විට එහි සියලු කාර්යයන් සම්පූර්ණ කිරීමට අපි සමත් විමු.

මෙම ව්‍යාපෘති හරහා සීනෝ(ර්) පදනම ලබාගත් දැනුම සහ අත්දැකීම් පසුව විශේෂයෙන් කොන්ත්‍රාත්කරුවන්ගේ හිඟයක් පවතින වෙලේ සහ අක් වෙරළ සමුද්‍රිත ඉදිකිරීම් පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට සමාගමට සහය විය.

රුපියල් මිලියන 275 ක ආයෝජනයෙන් මට්ටක්කුලිය නැව් තටාංගනය වැඩි දියුණු කිරීමේ කටයුතු සිදු කිරීමට 2014 වසරේදී සීනෝ(ර්) පදනමට හැකි විය.නවතම තාක්ෂණික උපාංගයන්ගෙන් සහ ෆයිබර් ග්ලාස් මුහුදු යාත්‍රා නිෂ්පාදනය සඳහා වන විශේෂිත සීනෝ(ර්) අවශ්‍යතාවන්ට ගැලපෙන පරිදි සැකසු උපාංගයන්ගෙන්ද යුක්තව ජ්‍යාත්‍යාන්තර ප්‍රමිතීන්ට ගැලපෙන මට්ටමකට මෙම නැව් තටාංගනය වැඩි දියුණු කරන ලදී.



**මට්ටක්කුළිය සීනෝර් නැව් තටාංගනය අත.**

2015 වසරේ සීනෝ(ර්) පදනමට සිදු කිරීමට ඉතිරිව ඇති එක් ප්‍රධාන කාර්යයක් වන්නේ නැව් තටාංගනයන්, වැඩපලක් සහ මත්ස්‍ය සැකසීමේ මධ්‍යස්ථානයක් කලයිනගර්හී ස්ථාපනය කිරීමයි. 2014 වර්ෂයේදී රුපියල් මිලියන 220 ක ආයෝජනයෙන් බෝට්ටු සහ ධීවර යාත්‍රා සහ වැඩ පලක් / අළුත් වැඩියා ස්ථාපනය කිරීමේ අරමුණින් මෙම ව්‍යාපෘති ආරම්භ කල අතර, එහි කටයුතු 2015 ආරම්භ කිරීමට බලාපොරොත්තු වේ.



**මට්ටක්කුළිය සීනෝර් නැව් තටාංගනය එදා**

මෙම ක්‍රියාවලින් හරහා ලබා ගත් දැනුම අත්දැකීම් භාවිතයෙන් මට්ටුක්කුලිය නැව් තටාංගනය සාර්ථකව සම්පූර්ණ කිරීමේ අවසානය මත එහි සියලුම කටයුතු අප විසින්ම සිදු කිරීමට අදහස් කරන ලදී.

2014 වසරේ සීමාසහිත සීනෝ(ර්) පදනමේ අත්පත් කර ගත් සතුටුදායක තත්වය යටතේ 2015 වසරේදී වඩාත් හොඳ පළදාවක් ලබා ගැනීමේදී උනන්දුව සහ විශ්වාසය අතැතිව ඉදිරියේ ඇති අභියෝග භාර ගැනීමට ආයතනය සූදානමින් සිටී.

## ස්තූතිය.

2014 වර්ෂය තුලදී සීමාසහිත සීනෝ(ර්) පදනමට සිය අරමුණු ලඟා කර ගැනීම සඳහා උපදෙස් ලබා දුන් ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යංශයේ ගරු අමාත්‍යතුමාටත් එමෙන්ම නිසි මඟ පෙන්වීම හා සහයෝගය ලබා දුන් අමාත්‍යංශ ලේකම් තුමියගේ සේවයත් මෙහිදී ඉතා අගය කොට සලකමි. නෝ(ර්) පදනම මඟින් නොයෙක් ගැටලු සමඟ කටයුතු කරමින් අමාත්‍යංශ කාර්යය මණ්ඩලය ලබා දුන් සහයෝගය ද මේ අවස්ථාවේ ඉතා කෘතවේදීව සිහිපත් කරමි.

වර්ෂය තුළ බොහෝ මාළු දැල් ඇණවුම් ලබා දෙමින් සීනෝ(ර්) පදනමට සහයෝගය දුන් ධීවර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකතුමාට ද විශේෂයින් ස්තූතිවන්ත වෙමි.

මෙම වසර තුළ මාගේ අධීක්ෂණය යටතේ සීමාසහිත සීනෝ(ර්) පදනමෙහි සිය කටයුතු සාර්ථක ලෙස අත්පත් කර ගැනීම සඳහා සහය වූ අධ්‍යක්ෂක මණ්ඩලයටත්, මෙහිදී ස්තූතිවන්ත වෙමි.



ඉංජිනේරු  බී.පී. සරත් කුමාර ද සිල්වා
සභාපති  සීමාසහිත සීනෝ(ර්) පදනම

## 2014 වර්ෂයේදී ලබාගත් ජයග්‍රහණ.

**මට්ටක්කුලිය නැව් තටාංගනය වැඩි දියුණු කිරීම.**

රුපියල් මිලියන 275 ක විශාල ආයෝජන ව්‍යාපෘතියක් මගින් නවීකරණය කරන ලද මට්ටක්කුලිය නැව් තටාංගනය ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්ත ක්ෂේත්‍රයේ ඉදිකරන ලද නවීනතම නැව් තටාංගනයයි. පහත සඳහන් අංග එහි ඇතුලත් කර ඇත.

ගැබියම් ආරක්ෂක පවුල.



කොන්ක්‍රීට් බදාම යොදා බිත්ති බැඳීම වෙනුවට ජැටි බැම්ම ඉදිකිරීමේ ක්‍රමවේදයට බෙහෙවින් සමාන වූ ඉතා ලාභදායී ඉදිකිරීම් ඉංජිනේරු ක්‍රමවේදයක් මෙම ගැබියම් බිත්ති නිර්මාණය සඳහා යොදා ගැනුණි. ගැබියම් පවුර ගොඩබිම ආරක්ෂාව සඳහා දායක වන අතරමඑ ය නැව් බැඳ තැබීය හැකි සහ ගොඩබිමට රැගෙන යාමෙන් තොරව අඩු පිරිවැයකින් වසරකට නැව් 05 ක ප්‍රමාණයක් නවතා තබා අලුත් වැඩියා කළ හැකි ජැටියක් ලෙසද භාවිතා කරනු ලබයි. මෙම ගැබියම් පවුරු විශාල ලෙස සමුද්‍ර බාදනයට ලක් වූ විශාල ආරක්ෂණය භූමි ප්‍රදේශ වලින් විශාල කොටසක් නැවත ගොඩ කිරීම සඳහා දායක වී ඇත.

ටොන් 25 බරුති ලින්දියක් සහිත ලිහිසි මාර්ගය.



දඹර සඳහා වූ ලිහිසි මාර්ගය ශ්‍රී ලංකාවේ නැව් තටාංගනය නවීකරණය කිරීමේදී අලුත් සංකල්පයක් වූයේ එය මෙතෙක් ලංකාවේ නැව් තටාංගන ක්‍රියාකරුවන් විසින් අත්හදා නොබලන ලද පහසුකමක් වීම හේතුවෙනි.

ලිහිසි මාර්ග ඉදිකරනු ලබන්නේ ශක්තිමත්ව සකස් කරන ලද උස් වූ ස්ථානයක ය. එය වියදම් අධික කාර්යයකි. උපදේශකවරුන් හා සාකච්ඡා කිරීමෙන් අනතුරුව කොන්ක්‍රීට් වලින්ම සකස් කරන ලද අනම්‍ය වූ පෘෂ්ඨයක වන ලිහිසි මාර්ගය වෙනුවට නම්‍යශීලි පෘෂ්ඨයක් මත වන ලිහිසි මාර්ගයක් සෑදීම සඳහා සැලසුම් සකස් කෙරිණි. එම ලිහිසි පෘෂ්ඨය පහසුවෙන් එසවීමට සහ නැවක ස්ථාන ගත වීමට පහසු වන පරිදි සකස් වූවකි.

මෙම ලිහිසි මාර්ගය යොදා ගැනීම හේතුවෙන් නැව් දියත් කිරීමට ගත වන පිරිවැය සහ කාලය සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු විය.

**ආර්ද්‍රතා පාලන ඒකකය.**

60% 70% වන ජාත්‍යන්තර ප්‍රමිතිකරන පරාසයට අනුව ෆයිබර් ග්ලාස් කර්මාන්තයේ යෙදීමේදී වන දුර්වලතා අවම කරමින් ඒවා ජ්‍යාත්‍යාන්තර වෙළඳපළ තත්වකරණයට ලගා වූ නිර්මාණයක් කිරීමේදී ආර්ද්‍රතාවය පාලනය කිරීම මෙම මැදිරිය මගින් සිදු කරනු ලබයි. සීනෝ(ර්) නැව් තටාංගනය ටොන් 05 ක් බරැති ඉහළ ස්ථානයක රඳවා තැබූ දොඹකරයක්, ජෙල් ආලේපනයක් සහ දුම්මල ස්ප්‍රේ යන්ත්‍රයක්, පට්ටල යන්ත්‍ර, ටික්නික් පෑස්සුම් යන්ත්‍ර, මිලින් යන්ත්‍ර, මුළු ඔසවන ප්ලාස්මා කැපීමේ යන්ත්‍ර Boat Traitors ටොන් 05 සිට 70 බරැති ආදී විවිධ නවීන උපරණ වලින් සමන්විත වේ.

මෙකී සියලු අංගෝපාංග සහිතව සහ නවීනතම උපකරණ සහ තාක්‍ෂණික ක්‍රමවේද යොදා ගිනිමින් මට්ටක්කුලිය නැව් තටාංගනය අලුත් වැඩියා කිරීම නිසා පාරිභෝගිකයන්ට අවශ්‍ය කරන්නා වූ අලුත් වැඩියා පහසුකම් දැඩි විශ්වාසයකින් යුතුව සපයා දීමට සීනෝ(ර්) සමාගමට හැකියාව ලැබිණි.



**ඉදිකිරීම් කටයුතු - වෙරළ සහ අක් වෙරළ නාවික ඉදිකිරීම.**

දික්ඕවිට නැංගුරම්පල ව්‍යාපෘතිය.

2015 අප්‍රේල් මාසයේදී මුලිකවම ඉදිකිරීම් නිම කිරීමට අපේක්‍ෂා කල මෙම ව්‍යාපෘතියෙහි සම්පූර්ණ වැඩ කටයුතු 2014 වර්ෂයේ නොවැම්බර් මස දී සාර්ථකව නිම කිරීමට සීනෝ(ර්) සමාගමට හැකි විය. එම ව්‍යාපෘතියෙහි වටිනාකම රුපියල් මිලියන 70.2 කි.



බේරුවල මරදාන නැංගුරම්පළ

පිළිවෙලින් රුපියල් මිලියන 118 ක් සහ රුපියල් මිලියන 81 ක් වැය වන අදියර 02 න් යුක්ත වන විශාල ප්‍රමාණයේ නාවික ව්‍යාපෘතියක් වූ අතරමෙය ධීරවර හා ජලජ සම්පත් අමාත්‍යංශය විසින් සීනෝ(ර්) ආයතනයභාර දෙන ලද ව්‍යාපෘතියකි. සැලසුම්කරණය මෝසම් වර්ෂා කාලයට පෙර ආරක්ෂිත කන්චුක සහ අභ්‍යන්තර උපකරණ එක්රැස් කිරීම තුළින් මෙකී ඉදිකිරීම් ක්‍රියාවලිය කඩිනම් කිරීම ඉතා සංකීර්ණසේම අභියෝගාත්මක කටයුත්තක් විය.

2014 දී මෙම ව්‍යාපෘතියේ වැඩකටයුතු 90% න් අවසන් වූ අතර, මෙම ප්‍රගතිය සහ නව්‍යතන ආකාරයෙන් වන ඉදිරිකිරීම් සීනෝ(ර්) ආයතනය අක්වෙරළ ඉදිකිරීම් කටයුතු වලදී ප්‍රමුඛ ආයතයක් බව ප්‍රකට කරන්නක් විය.

## ෆයිබර් ග්ලාස් බෝට්ටු සහ ඒ ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදනය.

ධීවර ආම්පන්න සහ දැල් විදිනයක්, ලයින් හොල්ඩරයක්, ශීතකාමර වැනි උපකරණ ඇතුලු නවීණ පහසුකම් වලින් සමන්විත වූ අඩි 42 ක් පමණ දිගැති ගැඹුරු මුහුදු යාත්‍රා 02 සීනෝ(ර්) ආයතනය විසින් සෝමාලියාව වෙත අපනයනය කරන ලදී. සීනෝ(ර්) ආයතනය විසින් වත්වාගෙන යනු ලබන පාරිභෝගිකයන් රඳවා ගැනීමේ උපායශීලිත්වයේ ප්‍රතිපලයක් ලෙසසු ලිසුළගකින් දැඩි ලෙස හානියට පත් වූ අඩි 45 ක් පමණ දිගැති ගැඹුරු ධීවර යාත්‍රාවක් අලුත් වැඩියා කිරීම සඳහා සෝමාලියානු පාරිභෝගිකයකුගෙන් ස්ථිර ඇණවුමක් ලබා ගැනීමට මෙම ආයතනයට හැකියාව ලැබුණි.



2014 වර්ෂයේදී සීනෝ(ර්) ආයතනය මඟින් මිරිස්ස ප්‍රදේශයේ සංචාරක කටයුතු සඳහා අඩි 45 පමණ දිගැති සගිම් තල්මසුන් නැරඹීමේ මගී යාත්‍රාවක් නිර්මාණය කරන ලදී. මෙම යාත්‍රාවේ නාවික සංචාරක වේගය නාවික සැතපුම් 11 වැඩි වන අතර, මඟින් 100 ක් පමණ එක්වර නවාතැන් ලබා දිය හැකි ශක්තිමත් යාත්‍රාවකි.

මෙම වර්ෂය තුළදී සීනෝ(ර්) ආයතනය විසින් මිරිදිය ධීවර කර්මාන්තය සඳහා අවශ්‍ය ඔැරු විශාල ප්‍රමාණයක් නිෂ්පාදනය කරන ලදී. මෙම ඇණවුම් වලින් විශාල ප්‍රමාණයක් ලැබී තිබුණේ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යංශය මඟින් හා දිවයින පුරා පිහිටා ඇති විවිධ ප්‍රාදේශීය සභා ආයතන මඟිනි. මෙයට අමතරව මාළු පෙට්ටි, අයිස් පෙට්ටි, අවි ගබඩා පෙට්ටි, ආරක්ෂක කුඩාරම් යන ආදී විවිධ උපාංග විශාල ප්‍රමාණයක් නිෂ්පාදනය කිරීමට සීනෝ(ර්) මසමාගමට හැකියාව ලැබුණි.

වගුව 01 ෆයිබර් ග්ලාස් බෝට්ටු සහ ඒ ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදනය.

| වර්ගය | 2014 සඳහා නිමැවුම් (ඒකක) | 2013 සඳහා නිමැවුම් (ඒකක) |
|---|---|---|
| අඩි 42 දිගැති බහු දින ධීවර යාත්‍රා | 02 | |
| අඩි 45 දිගැති මගී යාත්‍රා | 02 | 02 |
| විනෝද යාත්‍රා | 05 | 02 |
| මිරිදිය ධීවර ඔරු | 536 | 436 |
| අඩි 18.5 සහ 19.5 දිගැති FRR බෝට්ටු | 37 | 79 |
| හබල් බෝට්ටු | - | 04 |
| පාලම් ඔරු සහ තෙප්පම් | 09 | - |
| කට්ටු | - | 46 |
| මාළු පෙට්ටි / අයිස් පෙට්ටි | 128 | 125 |
| පාවෙන ජැටි / පාවෙන අවන්හල් | 02 | - |
| විවිධ නිශ්පාදන (ආයුධ ගබඩා, පෙට්ටි, ආරක්ෂක කූඩාරම්) | 623 | 1,065 |
| **මුළු එකතුව** | **1,344** | **1,759** |

මුලාශ්‍රය සැලසුම් ඒකකය සීමාසහිත සීනෝ(ර්) සමාගම

නාවුක යාත්‍රා උපදේශන සේවා සීනෝ(ර්) ආයතන ඉතිහාසයේ පළමු වතාවට ධීවර හා ජලජ සම්පත් සංවර්ධ අමාත්‍යංශය සඳහා චීනයේ මව් යාත්‍රාවක් මිළ දී ගැනීමේදී අවශ්‍ය වූ ප්‍රසම්පාදන ක්‍රියාවලියේදි ඒස ඥහා උපදේශන ආයතනය ලෙස කටයුතු කිරීමට මෙම ආයතනයට හැකි විය. අවශ්‍ය පිරිවිතර නිරීක්ෂණය කිරීමේදී සහ මෙකී ක්‍රියාවලිය සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමේදී සීනෝ(ර්) ආයතනය එහි වගකීම ඉසිලීය.

**සීමාසහිත ශ්‍රී බංගලා (පෞද්ගලික) සමාගම - බංගලාදේශ කොටස්කරුවන් සමඟ වන හවුල් ව්‍යාපාරය.**

බංගලාදේශ කොටස්කරුවන් සමඟ වන සම හවුල් ව්‍යාපාරය සමඟ එක්ව නැව් තටාංගනයේ ඉදිකිරීම් නිම කල අතර, ඔවුන්ගේ පළමු පිරක්සුම් නෞකාව 2015 වර්ෂයේදී යාත්‍රා කිරීමට නියමිතය. මෙම ක්ෂේත්‍රයට දක්ෂතා ඇති සීනෝ(ර්) ආයතනයේ සේවකයන් විසින් මෙම කටයුත්ත සඳහා මූලික වී ක්‍රියා කරන ලද අතර, තවත් එවැනිම පිරික්සුම් යාත්‍රාවක් 2015 වර්ෂයේදී සැදීමට අපේක්ෂා කර ඇත.

**වෙනත් ව්‍යාපෘති.**

01. **සී-නෝ(ර්) පෙරදිග මුහුදු ආහාර අවන්හල.**
මෙම මුහුදු ආහාර අවන්හල 1998 දී ඇති කර ගත් කළමණාකරන ගිවිසුමකට අනුව සීමාසහිත ඔරියන්ට් ප්ලේස් හෝටල් සමාගම විසින් කර ගෙන යනු ලබයි. මෙහි ආයෝජිකයින් වන සීමාසහිත ඔරියන්ට් ප්ලේස් හෝටලය තම ව්‍යාපාරික ක්‍රමෝපාය ආන්ත්‍රික ආදායමක් ලබා ගැනීම සඳහා යොදා ගනු ලැබීය. සීනෝ(ර්) ආයතනය මෙමගින් මාසික බදු කුලියක් සහ ව්‍යාපෘතියේ ලාභාංශ වලින් 40% ක් ලබා ගැනීම සඳහා හිමිකම් කියයි.

02. **මෝටර් රථ වැඩපල - මත්තුමගල**
2006 වර්ශයේදී ඇති කර ගත් කළමණාකරන ගිවිසුමකට අනුව මෙම ව්‍යාපෘතිය සීමාසහිත ෆ්‍රන්ටියා(ර්) මෝටර් රථ ආයතනය විසින් ක්‍රියාත්මක කරනු ලබයි.

03. ISO සහතික කරණය.
සීමාසහිත සීනෝ(ර්) ආයතනය 2009 වර්ෂයේ සිට මේ දක්වාම ISO 9001 : 2008 සහතික කරණය සහතික කරණය සාර්ථකව පවත්වාගෙන යයි.

04. මානව සම්පත්.
වගුව 02 හි දක්වා ඇති ආකාරයට 2014 දෙසැම්බර් මස 31 වන දින වන විට ආයතනයේ සමස්ත කාර්යය මන්ඩලය 102 කි.

ඉහහත කාර්යය මණ්ඩලයේ සේවා බාණ්ඩය පහත දැක්වෙන පරිදි වේ.

**වගුව 2 මානව සම්පත් වපුහය**

| ස්ථානය | සේවක සංඛ්‍යාව |
|---|---|
| ප්‍රධාන කාර්යාලය | 50 |
| මට්ටක්කුලිය නැව් තටාංගනය | 33 |
| වෙළඳ ශාඛා<br>පෑලියගොඩ, මාතර, ගාල්ල, තංගල්ල හා තංගල්ල කර්මාන්තශාලාව | 08 |
| ඉදිකිරීම් ව්‍යාපෘති | 11 |
| එකතුව | 102 |

**මූලාශ්‍රය මානව සම්පත් අංශය**
Cey - Nor **පදනම**

| | |
|---|---|
| ස්ථිර කාර්යය මණ්ඩලය | 73 |
| කොන්ත්‍රාත්තු පදනම මත බඳවා ගන්නා ලද සේවකයින් | 29 |
| මුළු සංඛ්‍යාව | **102** |


**මූලාශ්‍රය - මානව සම්පත් අංශය සී-නෝ(ර්) පදනම.**
**2014 වර්ෂයේ මූල්‍ය කාර්යය සාධනය**

බදු පියවීමෙන් අනතුරුව ලබාගත් රුපියල් මිලියන 89 ක සැලකිය යුතු ලාභය.

අය බදු පියවීමෙන් අනතුරුව සීනෝ(ර්) පදනම ලබාගෙන ඇති තරමක විශාල ආදායම ලෙස වාර්ථා වන්නේ රුපියල් මිලියන 89 ක මුදලකි. මෙම ආදායම ලබා ගැනීමට මූලිකවම හේතු වූයේ මාළු දැල් සහ ජීවිත ආරක්ෂක කබායන් සඳහා ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යංශය විසින් ලබා දෙන ලද රුපියල් මිලියන 1216 ක ඇනවුමක් සහ සීනෝ(ර්) පදනම විසින් එහි නිමැවුම් කටයුතු ඉතා කාර්‍යක්ෂම ආකාරයෙන් සිදු කිරීම හේතුවෙනි. මෙම සියලු වැඩ කටයුතු 2014 වර්ෂයේදී සාර්ථක ලෙස සාක්ෂාත් කර ගැනීමට හැකියාව ලැබුනේ එහි සේවකයන් 100 දෙනා කැපවීම හේතුවෙනි. 2014 වර්ෂයේ සීනෝ(ර්) ආයතනයේ අරමුණ ලෙස මූලිකව ඉලක්ක ගත කර තිබුනේ එහි ආදායම වඩා ඉහළ තත්වයක නංවාලීමට කටයුතු කරන අතරම එහි පරිපාලන සහ අනෙකුත් ඉහළ පිරිවැය අඩු කිරීමයි. එහි ප්‍රතිඵලයක් ලෙස රුපියල් මිලියන 30 කඅයිරා ගිණුමක් සහ රුපියල් මිලියන 13.9 ක බැංකු ණය මුදලක් පියවීමෙන් ආයතනය මූල්‍ය පිරිවැය අවම කර ගැනීමට සීනෝ(ර්) ආයතනය සමත් විය. සීනෝ(ර්) පදනම විසින් අනුගමනය කරන ලද සාතල්‍ය ප්‍රවේශය හේතුවෙන් 2013 වර්ෂයට සාපේක්ෂව ඉහත සඳහන් අරමුණු සැලකිය යුතු ආකාරයකට සාක්ෂාත් කර ගැනීමට එම ආයතනය සමත් වී ඇත. මෙයට අමතරව සීනෝ(ර්) ආයතනය සිය ඉතිහාසයේ ප්‍රථම වතාවට සීය සීමාමායිම් වලින් ඔබ්බට ගොස් Re po වෙළඳපල වෙත ඇතුලු වී ඇති අතර, එහිදී කෙටි කාලීන ආයෝජන ක්‍රමෝපායන් භාවිතා කර රුපියල් 222.182.68 ක ආදායමක් ලබා ගැනීමට සමත් වී ඇත.

**වගුව 03 - ආදායම් මූලාශ්‍ර වලින් ලද ආදායම් ප්‍රමාණය.**

| විස්තරය | පිරිවැටුම රු. |
|---|---|
| ෆයිබර් ග්ලාස් නිෂ්පාදන | 79,117,213.28 |
| වෙනත් මෙහෙයුම් ආදායම් | 22,310,228.98 |
| වෙළඩ කටයුතු වලින් ලැබු ආදායම් | 766,686,838.88 |
| ඉදිකිරීම් කටුයුතු වලින් ලැබු ආදායම | 192,714,326.34 |
| මුළු ආදායම් | 1,060,828,607.48 |





**මූලාශ්‍රය :- මූල්‍ය අංශය සී-නෝ(ර්) පදනම**

වගුව - 04 පසුගිය වසර 05 තුළ වූ සිදුවීම් වල විශේෂ අවස්ථා.

| විස්තරය | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 |
|---|---|---|---|---|---|---|
| මුළු ආදායම | 255.60 | 345.99 | 324.75 | 217.75 | 267.09 | 1,060.83 |
| දළ ලාභය / පාඩු (ද.ලා) | 21.34 | 34.45 | 51.22 | 57.19 | 73.83 | 170.56 |
| ශුද්ධ ලාභය /පාඩුව (බදු) | (30.36) | (23.55) | (16.25) | (7.09) | 0.27 | 89.35 |
| ගණනයෙන් පසු (ශු.ලා) | 346.97 | 338.56 | 274.19 | 287.56 | 309.50 | 346.42 |
| ස්ථාවර වත්කම් (ශුද්ධ සංගනික වටිනාකම්) | 6.02 | - | - | - | 1.30 | 1.30 |
| ස්ථාවර තැන්පතු | 198.72 | 125.59 | 180.91 | 191.63 | 186.58 | 445.25 |
| ජංගම වත්කම් | 104.67 | 149.98 | 218.67 | 227.51 | 225.93 | 431.48 |
| ජංගම බැරකම් | 97.96 | 95.31 | 71.64 | 28.50 | 46.93 | 41.25 |
| ජංගම නොවන බැරකම් | 40.00 | 40.00 | 40.00 | 40.00 | 40.00 | 40.00 |
| කොටස් ප්‍රාග්ධනය | 255.67 | 232.12 | 178.09 | 231.55 | 231.55 | 320.91 |
| වෙනත් සංචිත සහිතවූ | (7.59) | (5.89) | (4.06) | (1.77) | .070 | 223.39 |

මූලාශ්‍රය - මූල්‍ය අංශය සී-නෝ(ර්) පදනම



**ඉදිරි සැලසුම්.**

- ❖ කරෙයිනගර් නැව් තටාංගනය නැවත ඉදිකිරීම සඳහා සීනෝ(ර්) පදනම මේ වන විටත් සැලසුම් සකස් කර ඇත. මූලි කසැලැස්ම පිළිගනු ලැබ ඇති අතර, උපදේශකවරුන් මේ වන විට සවිස්තරාත්ම කසැලසුම සකස් කරමින් සිටී. මෙම කර්මාන්තශාලාව ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 225 ක මුදලක් වෙන් කරනු ලැබ ඇති අතර සීනෝ(ර්) ආයතනය සිය අතීත අත්දැකීම් හා සිය දැනුම යොදා ගනිමින් මෙම කර්තව්‍ය සඳහා දායක වීමේ අපේක්ෂාවෙන් සිටී.

- ❖ කරෙයිනගර් නැව්තටාංගනය ඉදිකිරීම් නිම කර එහි ක්‍රියාකාරීත්වය ඇරඹූ පසු අපනයන තත්වයට යෝග්‍ය ධීවර බෝට්ටු, සංචාරක බෝට්ටු සහ කුඩු යාත්‍රා නිපදවීම අපේක්ෂා කරන අතර එමගින් සීනෝ(ර්) ආයතනය අනාගතයේදී සැලකිය යුතු ආදායමක් අපේක්ෂා කරයි.

- ❖ 2014 වර්ෂයේ සැප්තැම්බර් මස දී ධීවර කටයුතු අමාත්‍යවරයා විසින් මුල්ගල තබන ලද පැරැලිය නැංගුරම් පලෙහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට සීනෝ(ර්) පදනම අපේක්ෂා කරයි. අදියර 02 ක්යටතේ නිර්මාණය කරනු ලබන මෙම ව්‍යාපෘතියේ මුළු වටිනාකම රුපියල් මිලියන 400 කි.

- ❖ 43% ක පමණ ගවේශණ කටයුතු සිදු කරනු ලැබ ඇති ආර්ථික කලාපයේ ගැඹුරු ධීවර කර්මාන්තය ආරම්භ කිරීමේ වැදගත්කම ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යංශය පෙන්වා දී ඇත. රජය ධීවරයින් හට ධීවර බෝට්ටු සහ ධීවර ආම්පන්න මිලදී ගැනීම සඳහා සහනාධාර ලබා දීමට කටයුතු කරන්නේ නම් එකී වියදම මත්ස්‍ය ආයතනය මඟින් ලැබෙන්නා වූ විදේශ විනිමයින් ලබා ගත හැකි වන අතරම සමස්ථ පිරිවැය වසර 03 ඇතුලත පියවා ගත හැකිය. මෙම තත්වය මත ධීවර බෝට්ටු සහ ඒ ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ අවස්ථාව සීනෝ(ර්) පදනම වෙත ලැබෙනු ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා රාජ්‍ය අනුග්‍රාහය ලැබෙන්නේ නම් ධීවර අමාත්‍යංශයේ බහුදින ධීවර යාත්‍රා සඳහා වන ඇණවුම් බාර ගැනීමට සීනෝ(ර්) පදනම කැමැත්තෙන් පසු වේ.

- ❖ සීනෝ(ර්) පදනමේ භාණ්ඩ සඳහා විදේශ වෙළඳපල ආක්‍රමණය කිරීමේ පරමාර්ථය ඇතිව තරඟකාරී වෙළඳපලේ අලෙවි කරන ක්‍රියාකාරකම් කඩිනම් කිරීම සහ වර්ධන කිරීමෙහිලා පෞද්ගලික අංශය සමඟ තරඟ කිරීමට හැකි වන පරිදි අලෙවි අංශය වැඩි දියුණු කිරීම සඳහා ආයතනයේ ඉහළ කළමණාකාරීත්වය දියුණු පහසුකම් සහිතව බලගැන්වීම.

ආර්.එම්. ගුණසේකර
(FCA, BA, DPFM, FMAAT, Attorney-at-Law)

එම්.කේ.එන්.එස්. ගුණතිලක
(ACA, BSc (FM) SP, SAT)

**ගුණසේකර රත්නායක සහ සමාගම වරලත් ගණකාධිකාරිවරුන්**

නො.65/3,
සර් චිත්තම්පලම් ඒ,
ගාඩිනර් මාවත,
කොළඹ 02.

දුරකථන : 011 2335194
ෆැක්ස් : 011 2473833
ඊමේල් : komseky@gmail.com

**<u>ස්වාධීන විගණන වාර්ථාව.</u>**
සීමාසහිත සීනෝ(ර්) පදනමේ කොටස්කරුවන් වෙත.,
මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වන වාර්ථාව.

2014 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය තත්ව ප්‍රකාශයද ලාභ හෝ අලාභ පිළිබඳ ප්‍රකාශයද වෙනත් සැලකිය යුතු ආදායම් ව්‍යාපාර වස්තු වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය හා එයින් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ගැලීම් පිළිබඳ ප්‍රකාශයද ඉදිරිපත් කර ඇති සීනෝ(ර්) පදනම් ආයතනයේ මූල්‍ය ප්‍රකාශයන් පිළිබඳ අප විසින් විගණනයක් සිදු කර ඇති අතර, ඒ පිළිබඳ වන ගණකාධිකරණ ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශයක් සහ වැඩිදුර පැහැදිලි කිරීම සඳහා වන තොරතුරු මෙහි පුටු අංක 127 දක්වා ඇත.

මූල්‍ය වාර්තාව පිළිබඳ මණ්ඩලයේ වගකීම.
ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රතිපත්ති වලට අනුකූල වන පරිදි සත්‍ය හා සාධාරණ සමාලෝචනයක් සිදු කෙරෙන මෙම මූල්‍ය වාර්තා සම්පාදනය කිරීමේ වගකීම අධ්‍යක්ෂක මණ්ඩලයට පැවරෙන අතර, වංචාවක් නිසාවෙන් හෝ දෝෂයක් නිසාවෙන් හෝ වැරදි ප්‍රකාශන වලින් තොරව මෙම මූල්‍ය ප්‍රකාශන සම්පාදනය කිරීමට පහසුකම් සැලසීමද අධ්‍යක්ෂක මණ්ඩලය විසින් කළ යුතු වූවකි.

විගණන නිලධාරියාගේ වගකීම.
අපගේ විගණන දත්ත මතපදනම්ව මෙම මූල්‍ය වාර්තා පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම අප සතු වගකීමයි. අපි අපගේ විගණන කටයුතු සිදු කලේ ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූල වන පරිදිය. මෙම ප්‍රමිතීන් සඳහා අවශ්‍ය කෙරෙනුයේ අප විගණනය කළ ආචාර ධර්ම, මූල්‍ය ප්‍රකාශන සාවද්‍ය ප්‍රකාශ වලින් තොර වන්නේ දැයි හේතු යුක්ති සහගතව තහවුරු කර ගැනීම සඳහා සැලසුම් සහගතව මෙම විගණනය සිදු කළේය යන කරුණුය.

මූල්‍ය වාර්තාව තුළ වන හෙළිදරව් වීම සහ සංඛ්‍යා දත්ත පිළිබඳ විගණන සාක්ෂි ලබා ගැනීම සඳහා සිදු කරන විගණනයක විගණන කාර්යය පටිපාටි අන්තර්ගත වේ. මෙසේ තෝරාගනු ලබන විගණන පටිපාටි මූල්‍ය වාර්තාවේ සාවද්‍ය ප්‍රකාශන අවදානම තක්සේරු කිරීම ඇතුළු වංචාවක් හෝ ප්‍රමාද දෝෂයක් හේතුවෙන් හෝ මූල්‍ය වාර්තාව තුළ ඇති සාවද්‍ය ප්‍රකාශන ඇතුලත් වීමේ අවදානම ඇතුළු විගණන නිලධාරියාගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු වාර්තා සකස් කිරීමේදී සංයුතියට අදාල අභ්‍යන්තර පාලනයක් අදාළ තත්වයන්ට ගැලපෙන විගණන පටිපාටි සංම්පාදනය කර ගැනීම පිණිස එතෙක් ස්ථාපිත අභ්‍යන්තර පාලනයේ පලදායිතාවය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම අරමුණු කර නොගන්නා වූ සත්‍ය හා සාධාරණ දැක්වීමක් ගෙනහැර පාන මූල්‍ය ප්‍රකාශයක් සැකසීමේ කාරණා වලට අදාළ අභ්‍යන්තර පාලනය විගණන නිළධාරියා සිය සැලකිල්ලට ගනී. භාවිතා කර ඇති ගණකාධිකරණ ප්‍රතිපත්ති වල උචිත බව හා මණ්ඩලයේවිසින් සම්පාදනය කරන ලද ගණකාදිකරණ ඇස්තමේන්තු වල යුක්ති සහගත බාවය ඇගයුම් කිරීමත්, මූල්‍ය ප්‍රකාශනයේ සමස්ත පදිරිපත් කිරීම පිළිබඳව ඇගයුම් කිරීමත් විගණනයක් තුළ සිදු කෙරේ.
අප ලබාගෙන ඇති විගණන සාක්ෂි අපගේ විගණන මතය ප්‍රකාශ කිරීමෙහිලා පදනමක් ලෙස යොදා ගැනීමට ප්‍රමාණවත් හා සුදුසු බව අපි විශ්වාස කරමු.

මතය.

මෙම වාර්තාව, මෙම වාර්තාවේ අත්‍යවශ්‍ය කොටසක් වන 2015 මැයි 13 වන දිනැති අපගේ කලමණාකරන ලිපිය සමග සම්බන්ධ කොට කියවිය යුතුය. අපගේ අදහසට අනුව මෙම මූල්‍ය ප්‍රකාශනය 2014 දෙසැම්බර් 31 වන විට සමාගමේ මූල්‍ය තත්වය පිළිබඳ සහ ශ්‍රී ලංකා විගණුම්කරණ ප්‍රමිතීන් සමග වන මූල්‍ය කාර්යය සාදනය සහ එම අවසන් වූ වර්ෂයේ මුදල් ගැලීම් පිළිබඳව සත්‍ය සහ සාධාරණ අදහස් ඉදිරිපත් කරයි.

**සීමාසහිත සී-නෝ(ර්) පදනම**

සමස්ථ ආදායම් ප්‍රකාශනය

| දෙසැම්බර් 31 අවසන් වූ වර්ෂය සඳහා සටහන් | | 2014 | 2013 |
|---|---|---|---|
| | | රු. | රු. |
| බණ්ඩ මෙහෙයුම් ආදායම | 3 | 79,117,213.28 | 73,392,604.99 |
| විකුණුම් පිරිවැය | 4 | (82,056,523.28) | (62,441,119.06) |
| **මුළු ලාභය / පාඩුව** | | **(2,939,310.00)** | **10,951,485.93** |
| ඉදිකිරීම් සහ වෙළඳ කටයුතු වලින් ලැබූ මුළු ලාභාංශය | 5 | 173,499,511.90 | 45,630.962.54 |
| වෙත් මෙහෙයුම් ආදායම | 6 | 22,310,228.98 | 17,260,043.52 |
| අලෙවිය සහ බෙදාහැරීම සඳහා වන වියදම් | 7 | (18,202,054.15) | (14,158,412.61) |
| පරිපාලන වියදම් | 8 | (66,906,629.99) | (47,299258.69) |
| වෙනත් මෙහෙයුම් වියදම් | 9 | (2,597,356.37) | (1,098,055.49) |
| **මෙහෙයුම් ලාභය** | | **105,164,390.37** | **11,286765.20** |
| මූල්‍ය පිරිවැය | 10 | (5,070.580.43) | (10,727,241.55) |
| මූල්‍ය ආදායම | 11 | 325,712.52 | 97,446.87 |
| **බදු අයකිරීමට පෙර අඛණ්ඩ මෙහෙයුම් වලින් ලැබෙන ආදායම** | | **100,419,522,46** | **656,970.52** |
| ආදායම් බදු වියදම් | 12 | (11,064,150.46) | (379,468.28) |
| වර්ෂය සඳහා අඛණ්ඩ මෙහෙයුම් වලින් ලද ලාභය | | 89,355,372.00 | 277,502.24 |
| **අත්හිටුවන ලද මෙහෙයුම්** | | | |
| අත්හිටුවන ලද මෙහෙයුම් වල ලාභය බදු අයකිරීම් වලින් පසු | | | |
| **වර්ෂය සඳහා වූ ආදායම** | | **89,355,372.00** | **277,502.24** |

**වෙනත් නෛතික සහ නියාමක අවශ්‍යතා පිළිබඳ වන වාර්ථාව.**

අංක 07 2007 දරණ සමාගම් පණතේ 163 (2) වගන්තිය මගින් දක්වා ඇති ආකාරයට

(අ) විගණනය සඳහා පදනම් වූ මතවාද එහි විෂය පතය සහ සීමාවන් ඉහත දක්වා ඇති ආකාරයට වේ.

(ආ) අපගේ අදහස.

විගණනය සඳහා අවශ්‍ය කරන ලද සියලුම තොරතුරු සහ විවරණ අප ලබා ගෙන ඇති අතර අපට හැඟී යන ආකාරයට සමාගම විසින් නියම ගිණුම්කරණ වාර්ථා පවත්වාගෙන යනු ලබයි.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරණ සමාගම් පණතේ 151 වගන්තියේ දක්වා ඇති අවශ්‍යතා සමඟ අනුකූල වේ.

**ගුණසේකර රත්නායක සහ සමාගම,**
**වරගත් ගණකාධිකාරිවරුන්,**
**කොළඹ.**
**2015 ඔක්තෝබර් 21**

**සීමාසහිත සී-නෝ(ර්) පදනම**
**මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය**

| දෙසැම්බර් 31 වන විට | | **2014** | **2014** |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම - නොවන වත්කම්** | | | |
| දේපල සහ යන්ත්‍රෝපකරන | **13** | 346,422,896.03 | 309,503,287.18 |
| ප්‍රාග්ධනය WIP | | - | 4,145,000.00 |
| ආයෝජන ශ්‍රී බංග්ලා බෝට්ටු J-V | | 1,961,850.00 | 1,961,850.00 |
| අයෝජන ව්‍යාපෘති ධීවර කර්මාන්තය | | - | 2,239,404.26 |
| | | 348,384,746.03 | 317,849,541.44 |
| **ජංගම වත්කම්** | | | |
| භාණ්ඩ ලේඛණ ගත වත්කම | | 47,288,586.63 | 65,730,342.09 |
| සීමාසහිත නෝර්ත් සී සමාගම | | 14,528,796.01 | 38,845,840.65 |
| වෙළඳ ණයකරුවන් | | 320,899,038.78 | 51,898,367.73 |
| කාර්යයමණ්ඩල ණයකරුවන් | | 4,639,690.02 | 1,673,599.47 |
| වෙනත් අයවීම් | | 54,881,921.61 | 26,379,838.32 |
| ඇමතුම් තැම්පතු | | 1,300,000.00 | 1,300,000.00 |
| මුදල් සහ බැංකු | | 1,708,250.09 | 752,925.18 |
| **මුළු වත්කම්** | | **793,631,029.17** | **504,430,454,88** |
| **ව්‍යාපාර වස්තු අගය සහ බැරකම්** | | | |
| **ව්‍යාපාර වස්තු අගය** | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | | 40,000,000.00 | 40,000,000.00 |
| ආදායම් සංචිත | | 260,559,447.73 | 260,559,447.73 |
| ප්‍රග්ධන සංචිත | | 62,601,030.04 | 62,601,030.04 |
| පවත්නා ලාභ / (පාඩු) | | (42,251,505.62) | (131,606,875.46) |
| **මුළු ව්‍යාපාර වස්තූන් සඳහා අගය** | | **320,908,972.15** | **320,908,972.15** |
| **ජංගම නොවන බැරකම්** | | | |
| අමාත්‍යංශ ප්‍රතිපාදන | | 2,078,392.40 | 2,078,392.40 |
| විලම්භිත බැරකම් | | 33,687,123.01 | 44,425,160.73 |
| ණය ගැනීමේදී දරණ පොලිය | | 5,480,808.89 | 434,884.76 |
| සුනාමි පුනරුත්ථාපන වැඩසටහන් | | - | - |
| | | **41,246,324.30** | **46,938,437.89** |
| **ජංගම බැරකම්** | | | |
| ණය ගැනීමේදී දරණ පොලිය | | 1,476,304.17 | 322,411.11 |
| වෙළඳ ණය හිමියන් වෙනත් ගෙවීම් කටයුතු | | 168,683,199.19 | 49,603,067.45 |
| වන්දි ගෙවීම් කටයුතු යාපනය | | 241,297,311.25 | 81,897,545.88 |
| ආදායම් බදු ගෙවීම් | | 118,569.63 | 118,569.63 |
| කෙටිකාලීන ණය | | 7,300,126.46 | (5,389,530.24) |
| බැංකු අයිරා | | 10,633,248.04 | 63,209,065.34 |
| | | 1,966,973.99 | 36,177,285.51 |
| මුළු බැරකම් | | 431,475,732.72 | 225,938,414.68 |
| | | 472,722,057.02 | 272,876,852.58 |
| මුළුව්‍යාපාර වස්තු අගය සහ බැරකම් | | **793,631,029.17** | **504,430,454.88** |

## මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය
## ව්‍යාපාර වස්තු අගය මත වන වෙනස්කම් පිළිබඳ ප්‍රකාශනය
## 2014 දෙසැම්බර් 31 අවසන් වූ වර්ෂය සඳහා

| | කොටස් ප්‍රාග්ධනය | ප්‍රාග්ධන සංචිත | ප්‍රතිතක්සේරු කරන සංචිත | සමුච්චිත ලාභ / අලාභ | මුළු ව්‍යාපාර වස්තු අගය |
|---|---|---|---|---|---|
| 2013 ජනවාරි 01 දින ශේෂය | 40,000,000.00 | 62,601,030.04 | 260,559,447.73 | (131,884,376.86) | 170,998,057 |
| වර්ෂයේ ශුද්ධ අලාභය | - | - | - | 277,502,24 | 277,502.24 |
| 2013 ජනවාරි 31 දිනට ශේෂය | **40,000,000.00** | **62,601,030.04** | **260,559,447.73** | **(131,606,877.62)** | **231,553,600.15** |
| වර්ෂයේ ශුද්ධ අලාභය | - | - | - | 89,355,372.00 | 89,355,372.00 |
| 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය | **40,400,000.00** | **62,601,030.04** | **260,559,447.73** | **(42,251,505.62)** | **320,908,972.15** |

## මුදල් ගැලීම් ප්‍රකාශනය

| 2014 දෙසරම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා | 2014 | 2013 |
|---|---|---|
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලැබෙන මුදල් ගැලීම්** | | |
| බදුනකරණයට පෙර ලාභාශෙස | 100,419,522.46 | 656,970.52 |
| එකතු කරන ලද ක්ෂසවීම් ප්‍රමාණය | 14,714,513.71 | 12,924.336.02 |
| පාරිතොෂිත ප්‍රතිපාදන | 1,904,135.60 | 1,659,184.64 |
| පොලී ගෙවීම් | 5,070,580.43 | 10,449,152.19 |
| අඩ කරන ලද ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද ලාභය | - | - |
| පූර්ව වර්ෂ ලැලපුම | - | (279,459.38) |
| | **122,108,752.20** | **25,410,183.99** |
| **ව්‍යාපාඑයට යෙදවු මුලධන වෙනස්කම් වලට පෙර පැවති මෙහෙයුම් ලාභය** | | |
| භාණ්ඩ ලේඛන වල සංඛ්‍ය දත්ත අඩුවීම් | 18,441,755.46 | 16,453,195.86 |
| වෙළඳ සහ අනෙකුත් ගැබීම් වැඩිවීම / අඩුවීම | (274,526,296.17) | (20,760,983.59) |
| වෙළඳ සහ අනෙකුත් ගෙවීම් වැඩිවීම / අඩුවීම | 278,479,897.11 | 5,002,245.33 |
| විලම්භිත ආදායම් වැඩිවීම / අඩුවීම | (9,633,213.22) | 18,867,642.25 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලැබෙන මුදල්** | 134,870,895.38 | 44,972,283.84 |
| අඩු කරන ලද ආයෝජන ආදායම | (325,712.52) | (97,446.87) |
| ගෙවන ලද පොලිය | (5,070,580.43) | (10,449,152.19) |
| ගෙවන ලද බදු මුදල් | - | - |
| ගෙවන ලද පාරිතෝෂිතය | (3,008,960.10) | (1,491,427.64) |
| | **126,465,642.33** | **32,934,257.14** |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලැබෙන මුදල් ගැලීම්** | | |
| දේපල, යන්ත්‍රෝපකරණ ආදිය විකිණීම / මිළදී ගැනීම | (44,762,693.56) | (34,843,179.50) |
| ප්‍රාග්ධනය W.I.P | 4,145,000.00 | - |
| ආයෝජන ආදායම | 325,712.52 | 97,446.87 |
| සීමාසහිත ශ්‍රී බංග්ලා (පෞද්) සමාගම සමඟ ආයෝජන | 2,239.404.26 | - |
| කෙටි කාලීන ණය | (52,575,817.30) | 8,678.227.00 |
| | **(90,628,394.08)** | **(26,067,505.63)** |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලදී යොදාගනු ලබන ශුද්ධ මුදල්** | | |
| **මුල්‍ය ක්‍රියාකාරම් වලින් ලැබෙන මුදල් ගැලීම්** | | |
| රජයේ ප්‍රතිපාදන | - | - |
| කල්බදු ණය හිමියන් සඳහා ගෙවීම් | (671,611.81) | (275,938.58) |
| මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා යොදා ගනු ලබන ශුද්ධ මුදල් | **(671,611.81)** | **(2758,938.58)** |
| මුදල් හා මුදල් සම වටිනාකම්හි ශුද්ධ වර්ධනය | 35,165,636.43 | 6,590.812.93 |
| කාලසීමාව ආරම්භයේදී මුදල් සහ මුදල් සම වටිනාකම් | (34,124,360.33) | (40,715,173.26) |
| කාලසීමාව අවසානයේදී මුදල් සහ මුදල් සම වටිනාකම් | **1,041,276.10** | **(34,124,360.33)** |
| මහජන බැංකුව කුච්න් ශාඛාව | 322,135.76 | (373,543.80) |
| හැටන් නැෂනල් බැංකුව | 146,020.44 | 113,108.69 |
| හැටන් නැෂනල් බැංකුව | 26,823.58 | 26,823.58 |
| පැන්ඒෂියා බැංකුව | 2,941.80 | 2,941.80 |
| සුළු මුදල් අග්‍රිම | 160,000.00 | 187,000.00 |
| ප්‍රතිප්‍රවේශ ඒ/සී | 3.60 | (29.68) |
| ඉන්දම අග්‍රිම | 95,000.00 | 116,000.00 |
| ඇමතුම් තැම්පතු | 1,300,000.00 | 1,300.000.00 |
| ලංකා බැංකුව | (685,567.48) | 1,262,376.02 |
| ලංකා බැංකුව කොළඹ ශාඛාව. | (35,491,718.03 | (1,593,400.51) |
| | **(34,124,360.33)** | **1,041,276.10** |

**2014 දෙසැම්බර් 31 අවසන් වූ වර්ෂය සඳහා
ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන්.**

**01. සංයුක්ත තොරතුරු.**

**1.1) නීත්‍යානුකූල පදිංචිය සහ නෛතික ආකෘතිය.**

සීමාසහිත සීනෝර්(ර්) පදනම් ආයතනය ශ්‍රී ලංකාවේ සංස්ථා ගත කරන ලද සහ නීත්‍යානුකූලව ස්ථාපිත කරන ලද සීමා සහිත වගීම් දරණු ලබන සමාගමකි. මෙම සමාගමේ ලියාපදිංචි කාර්යාලය අංක 335, ඩී.ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10 යන ලිපිනයේ පිහිටා ඇති අතර, මෙම ආයතනයේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථාන මට්ටක්කුලිය සහ මාතර, ගාල්ල, තංගල්ල සහ පෑලියගොඩ යන වෙළඳ ශාඛා වල පිහිටුවා ඇත.

**1.2) ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙයුෙම් ස්වභාවය .**

මෙම වර්ෂය තුළදී සීනෝර්(ර්) සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් වුයේ ආනයනය කරන ලද සහ දේශීයව මිළදී ගනු ලබන ධීවර දැල් විකිණීම සහ නිෂ්පාදනය කරන ලද ධීවර බෝට්ටු සහ වෙනත් ෆයිබර් ග්ලාස් නිෂ්පාදන විකිණීමයි.

**1.3) මුල් ව්‍යාපාරය.**

පූර්ණ රාජ්‍ය සමාගමකි.

**1.4) සේවක සංඛ්‍යාව.**

වසර අවසානයේදී ලබා ගන්නා ලද තොරතුරු වලට අනුව සේවක සංඛ්‍යාව 91 ක් විය.

**02. සුවිශේෂ ගණකාධිකරණ ප්‍රතිපත්තිවල සාරාංශය.
සාමාන්‍ය ප්‍රතිපත්ති සැලසුම් පදනම**

2.1.1) 2013 දෙසැම්බර් 31 වන දිනට සහ එදිනට අවසන් වූ වර්ෂය සඳහා වන සමාගමේ මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය, සමස්ථ ආදායම් ප්‍රකාශනය, ව්‍යාපාර වස්තු අගයන්හි වෙනස්කම් සහ මුදල් ගැලීම් සහ ගිණුම් කරණ ප්‍රතිපත්ති සහ සටන් ශ්‍රී ලංකා ගිණුම් කරණ ප්‍රමිතීන් හා අනුකූලවේ.

ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇති මෙම මූල්‍ය ප්‍රකාශන මෙතෙක් පැවැති පිරිවැය පදනම මත සකස් කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශන සඳහා බලපෑම් ඇති කරනු ලබන උද්දමනකාරී සාධක සඳහා මෙහි ගැලපුම් සකස් කර නොමැත.

2.1.2) ගිණුම්කරණ ප්‍රතිපත්ති වල වෙනස්වීම් සහ වර්ෂය තුළ නව සහ සංශෝධිත ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතීන් අනුගමනය කිරීම.
පිළිගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති පූර්ව මුදල් වර්ෂයේ ගිණුම් කරන ප්‍රතිපත්ති හා එකඟ වේ.

2.1.3) සංසන්දනාත්මක තොරතුරු.
ආයතනය විසින් මෙම ගිණුම්කරණ ප්‍රතිපත්ති නිරන්තරයෙන් යොදාගනු ලැබ ඇති අතර ඒවා පූර්ව ශයෙන් යොදාගනු ලැබූ ප්‍රතිපත්තීන්ට අනුකූල වේ. පූර්ව වර්ෂ වාර්තාවෙහි වූ ඇතැම් සංඛ්‍යා සහ වැකකි මෙම වාර්තාවට උචිත වන පරිදි සංශෝදනය කරනු ලැබ ඇත.

**2.1.3) සංසන්දනාත්මක තොරතුරු.**

ආයතනය විසින් මෙම ගිණුම්කරණ ප්‍රතිපත්ති නිරන්තරයෙන් යොදාගනු ලැබ ඇති අතර ඒවා පූර්ව ශයෙන් යොදාගනු ලැබූ ප්‍රතිපත්තීන්ට අනුකූල වේ. පූර්ව වර්ෂ වාර්තාවෙහි වූ ඇතැම් සංඛ්‍යා සහ වැකකි මෙම වාර්තාවට උචිත වන පරිදි සංශෝදනය කරනු ලැබ ඇත.

**2.1.4) විදේශ මුදල් ගණුදෙනු.**

සියලුම විදේශ විනිමය ගණුදෙනු එම ගණුදෙනු සිදුවන අවස්ථාවේදී පැවැති විදේශ විනිමය අනුපාතයට අනුව ශ්‍රී ලංකා රුපියල් වලට මාරු කරනු ලැබේ. විදේශ මුදල් ඒකක වලින් දක්වා ඇති මූල්‍ය වත්කම් සහ බැරකම් වර්ෂ අවසාන විදේශ විනිමය අනුපාතයන්ට අනුව ශ්‍රී ලංකා රුපියල් වලට හෝ ඒ හා සදෘශ ඒකක වලට නැවත සමීක්ෂණය කරනු ලබයි.

**2.1.5) බදුකරණය.**

**ප්‍රවර්තන පවතින බදු.**

ආදායම් බදු සඳහා වන ප්‍රතිපාදන මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති ආකාරයට සහ මෙම සමාගමට අදාල විනිමය අනුපාතය අනුව අංක 10,2006 දරණ දේශීය ආදායම් පණතේ විධිවිධානයන්ට අනුව ගණනය කරන ලද ආදායම් හා වියදම් ක්‍රමවේද මත පදනම් වේ.

2.1.6) ශේෂපත්‍ර දිනයට පසුව සිදු කරන ලද ක්‍රියාකාරකම්.

ශේෂපත්‍ර දිනට පසුව සිදු කරන ලද සියලුම ප්‍රධාන ක්‍රියාකාරකම් සලකා බැලීමක් කරනු ලැබ ඇති අතර, මූල්‍ය ප්‍රකාශන වල ඒ සඳහා අවශ්‍ය ගැලපීම් සිදු කරනු ලැබ ඇත.

2.1.7) ණය ගැණුම් පිරිවැය.

කිසියම් වියදමක් දරා ගැනීමට සිදු කාලයේදී එම දරාගත් වියදම් ණය ගැනුම් පිරිවැය ලෙස හඳුන්වනු ලබයි.

**2.2) වත්කම් තක්සේරු කරණය සහ ඒවායේ මැනුම් පදනම.**

**2.2.1)භාණ්ඩ ලේඛණ /ඉන්වෙන්ට්‍රි**

පැරණි සහ වෙළඳපල ඉල්ලුම අඩු භාණ්ඩ සඳහා ගෙවීම් සිදු කිරීමෙන් අනතුරුව භාණ්ඩ ලේඛණ අඩු පිරිවැයකින් සහ විකිණීමෙන් ලැබෙන ශුද්ධ අගය මත ගණනය කරනු ලබයි. සාමාන්‍ය ව්‍යාපාර ක්‍රමවේදය තුළ භාණ්ඩ අලෙවි කරනු ලබන මිල වන්නේ විකිණීමෙන් ලැබෙන ශුද්ධ අගයයි. වර්තමාන ස්ථානයට මෙම භාණ්ඩ ගෙන ඒමේදී වැය වූ පිරිවැය සහ එහි තත්වය පහත සඳහන් සූත්‍රය මගින් ගණනය කරනු ලබයි.

**අමුද්‍රව්‍ය -**

පළමුව එළඹ පළමුව නිකුත් කරන පදනමින් සත්‍ය පිරිවැය

**නිෂ්පාදනය කරන ලද නිමි භාණ්ඩ-**

සාමාන්‍ය මෙහෙයුම් ධාරිතාවය මත පදනම් වූ ඉහළ සෘජු නිෂ්පාදනයේ ඖචිත්‍ය සමානුපාතය, සෘජු ශ්‍රමය සහ අමුද්‍රව්‍ය සඳහා වන සත්‍ය පිරිවැය.

**කාරක ප්‍රගතිය**

නිම කරණ ලද ප්‍රතිශතය මත සෘජු ශ්‍රමය සහ ඉහළ ස්ථාන නිෂ්පාදනයේ ඖචිත්‍ය සමානුපාතය, අමුද්‍රව්‍ය සඳහා වන සත්‍ය පිරිවැය

**මිළදී ගන්නා ලද නිමි භාණ්ඩ -**

පළමුව එළඹ පළමුව නිකුත් කරන පදනමින් සත්‍ය පිරිවැය.

**වෙනත් තොග -**

පළමුව එළඹ පළමුව නිකුත් කරන පදනමින් සත්‍ය පිරිවැය.

**2.2.2) වෙළඳ වෙනත් ලැබීම්.**

වෙළඳ සහ වෙනත් ලැබීම් අලාභ සහ සැක සහිත ණය විකිණීමෙන් ලැබෙ ප්‍රතිපාදන සැලසීමට වෙළඳ සහ වෙනත් ලැබීම් ඒවා තක්සේරු කරන ලද ප්‍රමාණයෙන් දක්වා ඇත.

**2.2.3) මුදල් සහ මුදල් සමාන වස්තු.**

අත ඉතිරිව ඇති මුදල්, ඉල්ලුම් තැම්පතු සහ පහසු මුදල් ඒකක වලට මාරු කල හැකි සහ වටිනාකම් වෙනස්වීම් පිළිබඳ අවදානමක් නොපතින කෙටි කාලීන ඉහළ වටිනාකමක් සහිත ආයෝජන මුදල් සහ මුදල් සමාන වස්තූන් ලෙස හඳුන්වනු ලබයි.

මුදල් ගැලීම් ප්‍රකාශනය සඳහා මුදල් හා මුදල් සමාන වස්තු ලෙස අත ඉතිරිව ඇති මුදල්, බැංකු තැම්පතු,ඉතිරිව පවතින ශුද්ධ බැංකු අයිරා කෙටි කාලීන කල්පිරීම් සහිත ආයෝජන (උදා : ලබා ගත් දින සිට මාස 03 ක් හෝ ඊට අඩු කාලයක් ගතවන ආයෝජන මුදල් සහ මුදල් සමාන වස්තු ලෙස සලකනු ලැබ ඇත.)

වක්‍ර ක්‍රමවේදය මත පදනම්ව පුළුල් ගැලීම් ප්‍රකාශනය ඉදිරිපත් කර ඇත.

**2.2.4) දේපල, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ**

**(අ) තක්සේරු පිරිවැය.**

දේපල, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ යනාදිය මූලික වශයෙන්ම වියදම් අධික වේ. දේපල, යන්ත්‍ර සහ උපකරණ සඳහා යන පිරිවැය යනු අනුශාංගික පිරිවැයද සමඟින් මිලදී ගැනීම සහ ඉදිකිරීම සඳහා වන පිරිවැය.

දේපල, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ යන ආදී අංග දෙවනුව තක්සේරු කරනු ලබන අවස්ථාවන්හිදී එවැනි සමස්ත වත්කම් ප්‍රමාණය නැවත තක්සේරු කරනු ලබයි. ප්‍රතිතක්සේරු කරනය ඒවායේ පවතින මුදල් ප්‍රමාණය, ශේෂපත්‍ර දිනට ඒවායෙහි පවතින සාධාරණ වටිනාකමට ප්‍රධාන වශයෙන් වෙනස් නොවන බව තහවුරු කිරීම සඳහා ප්‍රමාණවත් ක්‍රමාණුකූල ආකාරයකට සිදු කරනු ලබයි. මූල්‍යමය වත්කමක් ලෙස මූලිකව හඳුනා ගැනීමෙන් අනතුරුව ප්‍රතිතක්සේරු කරන ලද දේපල, යන්ත්‍රෝපකරන සහ උපාංග මිල අව ප්‍රමාණය කිරීමකින් තොරව ප්‍රතිතක්සේරු වටිනාකමට පවත්වාගෙන යනු ලබයි. අනෙකුත් සියලුම දේපල, යන්ත්‍රෝපකරන සහ උපාංග යනාදිය මෙතෙක් කර ඇති පරිදි ක්ෂය රහිත පිරිවැයක් ලෙස දක්වා ඇත.

වත්කමක් ප්‍රත්‍යාගණනය කිරීමේදී ධාරිත අගයේ ඕනෑම වැඩිවීමක් ප්‍රතායාගණන අතිරික්තයට සෘජුවම බැර කරනු ලැබේ. එසේ කරනු ලබන්නේ එම වත්කම හා සම්බන්ධ කලින් වියදමක් ලෙස සැලකූ පූර්ව ප්‍රත්‍යාගනනයේ අඩුවීමක් පවතින්නේ නම් පමණි. මෙම තත්වයන් තුළ පූර්ව ලියා තැබීම් තරම් වූ ආදායමක් ලෙසඑ ම වැඩිවීම සැලකේ. ප්‍රත්‍යාගණනයේ ප්‍රතිඵලයක් ලෙස වත්කම් ධාරිත අගයේ අඩු වීමක් ඇති විටකදී එම අඩු වීම වියදමක් ලෙස සැලකේ. එය එසේ වන්නේ එම වත්කම හා සම්බන්ධ පූර්ව වර්ධනය ප්‍රතිවර්තනය නොකරන්නේ නම් පමණි. වත්කමට අදාල ප්‍රත්‍යාගණන අතිරික්තයේ පවතින ඕනෑම ශේෂයක් එම වත්කම අවසන් වීමේදී සමුච්චිත ලාභයට සෘජුවම යවනු ලැබේ.

(ආ) **ප්‍රතිෂ්ඨාපන පිරිවැය.**

මූලිකවම තක්සේරු කරන ලද ඉහළ ක්‍රියාකාරීත්වයෙන් අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ ප්‍රතිෂ්ඨාපනය කිරීම හෝ පවත්වාගෙන යෑම පිණිස දේපල සහ යන්ත්‍රෝපකරන අළුත් වැඩියා කිරීම සහ නඩත්තු කිරීම සඳහා වැය කරනු ලබන වියදම එම වියදම සිදු වූ පසුව ප්‍රතිෂ්ඨාපන පිරිවැය ලෙස හඳුන්වනු ලබයි.

(ඇ) **ක්ෂය වීම.**

තක්සේරු කරන ලද එවැනි Usefull Lives මත වැය වන වියදම් කපා හැරීම පිණිස අවමප්‍රමාණය සඳහා වන ප්‍රතිපාදන සියලුම දේපල සහ යන්ත්‍රොපකරන සඳහා වන පිරිවැය මත ගණනය කරනු ලබයි. නැව් තටාංගනය සඳහා ලුණුවිල කර්මාන්තශාලාව සඳහා වන අවප5වාහන අනුපාත පහත දක්වා ඇති ආකාරයට වෙනස් වේ.

| | |
|---|---|
| ගොඩනැගිලි | වසර 20 යි |
| යන්ත්‍රෝපකරන | වසර 10 යි |
| ගෘහභාණ්ඩ සහ උපකරණ | වසර 05 යි |
| මෙවලම් සහ උපාංග | වසර 05 යි |
| කාර්යාලීය උපකරණ | වසර 05 යි |
| මෝටර් රථ | වසර 04 යි |
| පරිගණක | වසර 04 යි |
| මෘදුකාංග | වසර 05 යි |
| බෝට්ටු අච්චු | වසර 05 යි |
| කර්මාන්ත ශාලා උපකරණ | වසර 08 යි |
| බඳු අයිතිය සහ මෝටර් රථ | වසර 04 යි |

**වත්කම් හානි.**

සාමගම් සතු වත්කම් වල අඩු වීමක් පෙන්නුම් කරන්නේ දැයි සෑම මෙහෙයුම් සිනකටම සමාගම තක්සේරු කිරීමක් සිදු කරයි. එබදු කිසියම් දෙයක් දක්නට ඇත්නම් හෝ වත්කමක් සඳහා වාර්ෂික ක්ෂය වීම් පිළිබඳ පරීක්ෂාවක් අවශ්‍ය වන විට එම වත්කමෙහි පියවා ගත හැකි මුදල පිළිබඳ ඇස්තමේන්තුවක් සමාගම විසින් සකස් කරනු ලබයි. වත්කම ඉදිරියට ගෙන යන අගය එහි පියවා ගත හැකි අගයඅභිබවා යන අවස්ථාවන්හිදී එම වත්කම වත්කමක් ලෙස හඳුනා ගන්නා අතර, එහි පියවා ගත හැකි අගයට ඇතුලත් කර ඇත.

භාවිත අගය ගණනය කිරීමේදී මුදලේ කාලීන වටිනාකමේ වර්තමාන වෙළඳපල තක්සේරුව හා එම වත්කමට පවත්නා අවධානම් කාරකයන් පිළිබිඹු කරන්නා වූ පූර්ව මට්ටනම් අනුපාතය භාවිතා කරමින් ඇස්තමේන්තු ගත අනාතගමුදල් ගලායත් ඒවාගේ වර්තමාන අගය දක්වා අඩු කෙරේ.

පෙර හඳුනාගත් හානිවීම් වලින් ලැබූ අලාභයන් තව දුරටත් නොපතීද නැතහොත් ඒවා අඩු වී ඇත්දැයි පෙන්නුම් කිරීමක් තිබේ දැයි සොයා ගැනීමසඳහා වූ තක්සේරු කිරීමක් සෑම වාර්තාකරන දිනයකදීම සිදු කෙරේ. වත්කමේ පියවා ගතහැකි ගණනයේ වර්ධනයක් ඇත්නම් පමණක් ආයතනයෙහි කීර්ති නාමයට වූ හානි හැර පෙර හඳුනාගත් හානි නිසා සිදු වූ අලාභයන් අවශේෂණය කරනු ලැබේ. එවැනි වර්ධනයක් හඳුනාගනු ලබන්නේ ධාරිත අගයෙහි කිසිදු ආකාරයක පෙර හඳුනාගත් හානි සිනා ඇති වූ කිසිදු අලාභයත් නොමැති ගණනටය.

**2.3) බැරකම් සහ ප්‍රතිපාදන.**

**2.3.1) විශ්‍රාම ප්‍රතිලාභ පොරොන්දු .**

**(අ) නිශ්චිත ප්‍රතිලාභ සැලසුම - පාරිතෝෂිකය**

පාරිතෝෂිකය යනු නිශ්චිත ප්‍රතිලාභ සැලසුමකි. අදාල නීති ප්‍රකාරව මෙම පාරිතෝෂික ගෙවීමට සමාගම බැඳී සිටී. මෙම තත්වයට මුහුණ දීම සඳහා සේවය ආරම්භ කල දිනයේ සිටම සෑම සේවකයෙකුගේම සෑම සම්පූර්න කරන ලද සේවා වර්ෂයක් සඳහාම මූල්‍ය වර්ෂය අවසාන මාසයේ වැටුපෙන් අඩ මසක වැටුපකට සමානව ගණනය කරනු ලබන මුදලක් ශේෂපත්‍රයේ ඉදිරියට රැගෙන යාමක් සිදු කරනු ලබයි. වර්ෂය ආරම්භයේදී ඉදිරියට ගෙන එන ලද ප්‍රතිපාදනය සහ වර්ෂය අවසානය තෙක් රැගෙන යන ලද ප්‍රතිපාදනයන්හී වෙනස ආදායම් ප්‍රකාශනය තුළ දක්වා ඇත.

කෙසේ වුවද 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පණතට අනුව වසර 05 ක් අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් පසුව පමණක් මෙම මුදල සඳහා හිමිකම් ලබයි.

පාරිතෝෂික බැරකම් මෙම අයිතමය ශේෂපත්‍රයේ විලම්භිත බැරකම් ලෙස වර්ග කර ඇත.

**(ආ) නිශ්චිත උපකාරක සැලසුම් - සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල.**

අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල සඳහා හිමිකම් ලබන සියළුම සේවකයන් අදාල නීති සහ රෙගුලාසි සමඟ අදාළ අරමුදලින් ආවරණය වේ.

**(ඇ) පොළිය.**

එකතු විමේ පදනම මත පොළී ආදායම ගණනය කරනු ලබයි.

(ඈ)කුලී ආදායම.

එකතු වීමේ පදනම මත කුලී ආදායම ගණනය කරනු ලබයි.

**(ඉ) වෙනත් ආදායම්.**

එකතු වීමේ පදනම මත වෙනත් ආදායම් ගණනය කරනු ලබයි.

**(ඊ) ලාභ සහ පාඩු.**

දේපල සහ යන්ත්‍රෝපකරණ අලෙවි කිරීමෙන් ලැබෙන ආදායම් ආකාරයේ ශුද්ධ ලාභ සහ පාඩු අලෙවියෙන් ලැබෙන ලාභයෙන් අනතුරුව ආදායම් ප්‍රකාශනය සඳහා එකතු කරනු ලබයි. මෙම වත්කමට සම්බන්ධව ප්‍රතිතක්සේරු කරන සංචිත වල ඉතිරිව ඇති මුදල් සමුච්චිත ලාභ වෙත සෘජුවම මාරු කරනු ලබයි.

**2.4.2) වියදම් හඳුනා ගැනීම.**

වැය කරන ලද පිරිවැය සහ ආදායම් උපයන විශේෂ අයිතම වලින් ලද ඉපැයීම් අතර, පවතින ඍජු සම්බන්ධය මත ආදායම් ප්‍රකාශනයේ ඇති වියදම් හඳුනාගනු ලබයි. කාර්යක්‍ෂම ආකාරයට ව්‍යාපාරයක් පවත්වාගෙන යෑමේ දැරීමට සිදු වන වියදම සහ යන්ත්‍රෝපකරන නඩත්තු කිරීම සඳහා වැඩ වන මුදල වසරේ අපේක්ෂිත ආදායම් ලබා ගැනීමෙහිලා සකසන ආදායම් ප්‍රකාශයට ඇතුලත් කර ඇත.

ආදායම් ප්‍රකාශනය ඉදිරිපත් කිරීම සඳහා, සමාගමේ කාර්යය සාධනයේ අංශ ඉදිරිපත් කිරීම සඳහා වියදම් පටිපාටි ක්‍රම අනුගමනය කර ඇත.

**2.3.2) ප්‍රධාන වගකීම් සහ අවිනිශ්චිත අවස්ථා.**

ශේෂපත්‍ර දිනට වන ප්‍රධාන වගකීම් සහ අවිනිශ්චිත අවස්ථා බැරකම් මූල්‍ය ප්‍රකාශන සඳහා සකස් කරන ලද සටහන් වලින් අණාවරණය වේ.

**2.3.3) ප්‍රතිපාදන.**

පූර්ව සිදුවීමක් නිසා නෛතික හෝ සාධනීය බැදුම්කරණයක් ඇතිවන විට ශේෂපත්‍රයේ ඇති ප්‍රතිපාදන හඳුනාගනු ලබන අතර මෙම බැදුම්කරය පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ පිටතට ගලා යාමක් අවශ්‍ය වේ.

**2.4) ආදායම් ප්‍රකාශන.**

**ආදායම හඳුනා ගැනීම.**

ආර්ථික ප්‍රතිලාභ සමාගම වෙත ගලා ආ හැකි ප්‍රමාණය සහ ආදායම සහ ඒ ආශ්‍රිතව දරන ලද පිරිවැය සහ ඉදිරියට දැරීමට සිදු වන පිරිවැය නිර්වද්‍ය ලෙස මැනිය හැකි වීම යන කරුණු මත ආදායම හඳුනා ගනු ලබයි. මෙතෙක් ලැබී ඇති සහ ලැබීය හැකි ශුද්ධ වෙළද මට්ටම් සහ වෙළඳ බදු සැලකිල්ලට ගැනීමෙන් මෙම ආදායම මැනීම සිදු කරනු ලබයි. පහත සඳහන් විශේෂිත නිර්ණායක ආදායම හඳුනා ගැනීම සඳහා යොදා ගනු ලබයි.

**(අ) භාණ්ඩ විකිණීම.**

විකුණු භාණ්ඩ සම්බන්ධයෙන් ක්‍රියාකාරී පාලනයක් හෝ ඒවායේ අයිතිය සම්බන්ධයෙන් කිසිදු ආකාරයට කළමණාකරණ මට්ටමේ මැදිහත් වීමක් සමාගමට ඉතිරිනොකට භාණ්ඩ වල අයිතියේ වාසි මෙන්ම අවධානම් සමාගම විසින් ගැනුම්කරුවාට භාරදීමෙන් ලද ආදායම මෙහි විකුණු ආදායම ලෙසෙ සැලකේ.

**සමස්ථ ආදායම් ප්‍රකාශනය පිළිබඳව වන සටහන්.**

| දෙසැම්බර් 31 අවසන් වන වර්ෂය සඳහා. | 2014<br>රු. ශත. | 2013<br>රු. ශත. |
|---|---|---|
| **සටහන 03 - ආදායම** | | |
| යාත්‍රා විකිණීම දේශීය | 76,748,798.13 | 57,016,974.36 |
| ධීවර ආම්පන්න විකිණීම | - | 63,667.06 |
| වෙනත් | 2,368,415.15 | 16,316,000.93 |
| | 79,117,213.28 | 73,396,642.35 |
| අඩු කරන ලද : විකුණුම් මට්ටම | - | (4,037.36) |
| | **79,117,213.28** | 73,392,604.99 |
| **සටහන 04 - විකිණුම් පිරිවැය** | | |
| ආරම්භයේදී පැවති බඩු ප්‍රමාණය අමුද්‍රව්‍ය | 11,223,008.55 | 4,193,702.57 |
| ආරම්භයේදී පැවති බඩු ප්‍රමාණය WIP | 13,009,484.51 | 24,373,748.58 |
| ආරම්භයේදී පැවති බඩු ප්‍රමාණය FG | 4,379,958.16 | 4,987,968.16 |
| | 28,612,451.22 | 33,555,455.31 |
| එකතු කරන ලද : අමුද්‍රව්‍ය මිල දී ගැනීම | 32,488,577.02 | 36,231,527.02 |
| වෙනත් ද්‍රව්‍ය | 15,362,838.31 | 694,456.83 |
| | 76,463,866.55 | 70,481,439.16 |
| එකතු කරන ලද :නිමි භාණ්ඩ මිලදී ගැනීම සෘජු | - | 5,621,785.72 |
| නිමි භාණ්ඩ අභ්‍යන්තර ප්‍රවාහනය | - | 78,797.48 |
| අවසානයේ පවතින බඩු ප්‍රමාණය අමුද්‍රව්‍ය | 76,463,866.55 | 76,182,022.36 |
| අවසානයේදී පැවති බඩු ප්‍රමාණය අමුද්‍රව්‍ය | (6,067,617.91) | (11,223,008.55) |
| අවසානයේදී පැවති බඩු ප්‍රමාණය WIP | (3,837,716.39) | (13,009,484.51) |
| අවසානයේදී පැවති බඩු ප්‍රමාණය FG | (6,176,031.29) | (4,379,958.16) |
| පරිභෝජනය කරන ලද ද්‍රව්‍ය සඳහා වූ පිරිවැය. | **60,382,500.96** | **47,575,755.01** |
| එකතු කරන ලද : සෘජු වියදම් | 5,689,479.47 | 3,502,663.02 |
| වැටුප් සහ වේතන | 2,266,364.94 | 1,504,055.55 |
| දීමනා DIR | 590,109.47 | 625,662.50 |
| සේවක අර්ථ සාදක DIR | 682,737.52 | 617,314.38 |
| සේවක භාරකාර අරමුදල් | 170,684.40 | 222,603.92 |
| පාරිතෝෂික DIR | 338,206.50 | 168,551.00 |
| උපකොන්ත්‍රාත් මුදල් | 5,765,608.65 | 2,338,247.20 |
| මූලික පිරිවැය | **75,885,691.91** | **56,554,852.58** |
| **එකතු කරන ලද :- ඉහළ නිෂ්පාදන** | | |
| වැටුප් සහ වේතන | 1,810,481.25 | 1,879,670.00 |
| දීමනා | 548,838.45 | 504,501.52 |
| අතිකාල | 222,835.88 | 253,020.38 |
| සේවක අර්ථසාදක | 217,257.75 | 225,560.40 |
| සේවක භාරකාර අරමුදල | 54,314.44 | 56,390.10 |
| ක්ෂය මුදල් | 2,559,079.42 | 2,313,443.94 |
| විදුලිය | 528,999.00 | 376,964.64 |
| ගොඩනැගිලි නඩත්තුව | - | 32,978.00 |
| මෙවලම් සහ උපකරණ නඩත්තු කිරීම | 27,750.00 | 3,360.00 |
| යන්ත්‍රෝපකරණ නඩත්තු කිරීම | 49,282.00 | - |
| එන්ජින් බඩත්තු කිරීම | 27,211.92 | - |
| ජලය | 124,781.26 | 240,377.50 |
| නිෂ්පාදන පිරිවැය | **82,056,523.28** | **62,441,119.06** |

**සමස්ථ ආදායම් ප්‍රකාශනය පිළිබඳව වන සටහන්.**

| **දෙසැම්බර් 31 අවසන් වන වර්ෂය සඳහා.** | **2014** | **2013** |
|---|---|---|

**සටහන 05 - ඉදිකිරීම් සහ වෙළඳ කටයුතු වලින් ලැබෙන දළ ලාභය.**

| | | |
|---|---|---|
| **වැටුප්** | | |
| අඩු කරන ලද : | 766,686,838.88 | 113,045,648.74 |
| විකුණුම් පිරිවැය | **(628,331,929.87)** | (85,540,761.13) |
| | 138,354,909.01 | 27,504,887.61 |
| | 192,714,326.34 | 63,398,845.65 |
| ඉදිකිරීම් කටයුතු වලින් ලැබෙන ආදායම | (157,569,723.45) | (45,272,770.72) |
| ඉදිකිරීම් පිරිවැය. | 35,144,602.89 | 18,126,074.93 |
| | **173,499,511.90** | **45,630,692.54** |

(අ) ඉදිකිරීම් ආදායම් සහ වියදම් සඳහා පහත නම් සඳහන් වැඩි දියුණු කරන ලද ව්‍යාපෘති ඇතුලත් වේ. මට්ටක්කුලිය, මරදාන නැංගුරුම්පල සහ දික්ඕවිට නැංගුරම්පල

(ආ) BOQ යොමුව මගින් මැනුම් කරන ලද නිම කිරීම් ක්‍රමවේදයේ ප්‍රතිශතය මත ස්ථාවර මිළ නියම කර ඇති ඉදිකිරීම් කොන්ත්‍රාත් වලින් ලැබෙන ආදායම හඳුනාගනු ලබයි.

(ඇ) කොන්ත්‍රාත්තුව නිම කිරීමේ අදියර කොන්ත්‍රාත්තුවේ භෞතික සමානුපාතයේ නිම කිරීම් මත තීරණය වේ.

(ඈ) 2014 වර්ෂය සඳහා ලැබූ අත්තිකාරම් මුදල් ප්‍රමාණය පහත දක්වා ඇත.

| | |
|---|---|
| මරදාන නැංගුරම්පළ | 237,489,380.00 |
| දික්ඕවිට නැංගුරම්පළ | 11,382,624.00 |
| | **248,872,004.00** |

(ඉ) 2014.12.31 වන විට පවත්නා මුදල පහත දක්වා ඇත.

| | |
|---|---|
| මට්ටක්කුලිය නැව් තටාංගනය වැඩි දියුණු කිරීම. | 4,429,435.11 |
| මරදාන නැංගුරම්පළ | 4,797,851.00 |
| දික්ඕවිට නැංගුරම්පළ | 3,514,115.00 |

**සටහන 06 - වෙනත් මෙහෙයුම් ආදායම.**

| | | |
|---|---|---|
| බදු කුලී ආදායම | 11,510,274.51 | 6,493,917.63 |
| සෙසු ආදායම් | 10,000.00 | 1,132,912.67 |
| රජයේ ප්‍රතිපාදන | 9,633,213.22 | 9,633,213.22 |
| අවන්හලෙන් ලැබෙන ආන්තික ලාභය | 451,203.11 | - |
| විනිමය ලැබීම් | 705,538.14 | - |
| | **22,310,228.98** | **17,260,043.52** |

**සමස්ථ ආදායම් ප්‍රකාශනය පිළිබඳව වන සටහන්.**

| දෙසැම්බර් 31 අවසන් වන වර්ෂය සඳහා. | 2014 | 2013 |
|---|---|---|
| **සටහන 07 -විකිණීම් සහ බෙදාහැරීමේ වියදම්** | | |
| ක්ෂය වීම | - | |
| ප්‍රවාහනය සහ මෙහෙයවීම | 300,666.00 | 713,689.37 |
| වාහන අලුත්වැඩියාව සහ නඩත්තු පිරිවැය | 3,887,483.54 | 3,128,357.39 |
| අලෙවි ප්‍රවර්ධන | 1,496,694.00 | 29,348.00 |
| විකුණුම් කොමිස් | 1,411,119.47 | 2,477,744.13 |
| ත්‍යාග සහ පරිත්‍යාග | 286,786.00 | 267,906.98 |
| ඉන්ධන සහ ලිහිසි තෙල් | 1,753,640.00 | 1,011,276.29 |
| ප්‍රසම්පාදන මුදල් | 5,433,342.87 | 4,245,069.95 |
| මුද්දර තීරු බදු | 106,700.00 | 65,957.00 |
| වාහන කුලී | 96,764.99 | 36,849.50 |
| බාහිර කුලී ගාස්තු | 1,062.500.00 | 480,334.00 |
| පැටවීම් සහ බෑම සඳහා වූ වියදම් | - | 607,590.00 |
| ප්‍රදර්ශණ වියදම් | 530,813.00 | 800.00 |
| අපනයන වියදම් A/C | 447,138.95 | - |
| වෙළඳ දැන්වීම් | 220,630.00 | - |
| | - | 30,000.00 |
| | 1,167,775.33 | 1,063,490.00 |
| | **18,202,054.15** | **14,158,412.61** |
| **සටහන 08 - පරිපාලන වියදම්** | | |
| වැටුප් සහ වේතන | 26,390,230.89 | 19,184,743.61 |
| අතිකාල | 2,234,198.26 | 1,519,501.13 |
| දීමනා | 7,341,588.56 | 4,020,461.57 |
| සේවක අර්ථසාධක දීමනා | 2,662,339.43 | 2,292,982.27 |
| සේවක භාරකාර අරමුදල | 665,584.89 | 573,245.56 |
| ප්‍රසාද සහ දිරි දීමනා | 2,925,464.19 | 1,677.27 |
| පාරිතෝෂික | 1,565,926.10 | 1,490,633.64 |
| දුරකථන ගාස්තු | 1,152,331.05 | 989,081.01 |
| අනියම් වේතන | | 6,592.36 |
| සුභසාධ ගාස්තු | 1,588,703.01 | 1,061,699.61 |
| තැපැල් ගාස්තු | 57,195.00 | 58,081.17 |
| කුරියර් ගාස්තු | 4,375.64 | - |
| ගොඩනැගිලි නඩත්තුව | 1,561,870.50 | 298,544.98 |
| පරිගණක නඩත්තුව | 266,870.50 | 110,835.00 |
| කාර්යාලීය උපකරණ නඩත්තුව | 360,013.00 | 177,255.00 |
| ජලය | 250,278.12 | 454,959.67 |
| විදුලිය | 1,901,955.11 | 1,908,825.56 |
| මුද්‍රණය සහ ලිපි ද්‍රව්‍ය | 1,624,118.50 | 1,725.192.75 |
| ක්ෂය වීම | 1,175,346.91 | 1,279,414.44 |
| නෛතික ගාස්තු | 668,947.34 | 329,510.58 |
| රක්ෂණ | 1,433,546.30 | 821,999.08 |
| ආරක්ෂක වියදම් | 4,132,544.84 | 3,522,192.60 |
| අන්තර්ජාල සහ විද්‍යුත් තැපැල් ගාස්තු | 145,667.42 | 127,217.58 |
| අගයන් සහ බදු | 145,993.11 | 137,209.96 |
| පිරිසිදු කිරීම සහ සනීපාරක්ෂාව | 657,367.00 | 288,788.00 |
| බදු කුලී වියදම් | 1,286,548.00 | 699,000.00 |
| බලපත්‍ර සහ ලියාපදිංචි කිරීම් | 154,834.57 | 1,500,801.59 |

**සමස්ථ ආදායම් ප්‍රකාශනය පිළිබඳව වන සටහන්.**

**දෙසැම්බර් 31 අවසන් වන වර්ෂය සඳහා.**

| | | |
|---|---|---|
| විගණකවරුන් සඳහා ගෙවීම් | 152,000.00 | 290,000.00 |
| අධ්‍යක්ෂක සඳහා ගෙවීම් | 1,262,043.59 | 1,236,000.00 |
| වෛද්‍ය ගාස්තු | 72,772.10 | 56,023.65 |
| පුහුණු වැඩමුළු සහ සම්මන්ත්‍රණ | 213,145.00 | 20,500.00 |
| සංචාරය, පුහුණු වැඩසටහන් සහ සම්මන්ත්‍රණය | 776,994.00 | 108,180.00 |
| ආහාර සඳහා නවාතැන් | 501,477.00 | 356,882.00 |
| අතිරේක ගාස්තු / වන්ති ගෙවීම | 200.89 | 57,528.06 |
| උත්සව වියදම් | 15,572.00 | - |
| පොත් සහ වාර ප්‍රකාශන | 4,000.00 | - |
| ගෘහ භාණ්ඩ සහ මෙවලම් නඩත්තු කිරීම | 2,000.00 | - |
| ISO පිළිවෙල | 55,243.00 | - |
| ලේබම් කරන ගාස්තු | 153,246.00 | - |
| උපදේශණ ගාස්තු | 683,100.00 | 643,881.95 |
| ගමන් ගාස්තු / දේශීය | 660,876.86 | 567,159.18 |
| | **66,906,629.99** | **47,916,600.83** |

**සටහන 09 - වෙනත් වියදම්**

| | | |
|---|---|---|
| බැංකු ගෙවීම් සහ කොමිස් | 172,848.09 | 976,060.20 |
| බදු කුලී පොලිය. | 185,104.02 | 121,995.29 |
| ආයෝජන වලින් ලත් අලාභ | 2,239,404.26 | - |
| | **2,597,356.37** | **1,098,055.49** |

**සටහන 10 -මූල්‍ය පිරිවැය**

| | | |
|---|---|---|
| | | - |
| බැංකු මුදල් සහ කොමිස් | 2,351,871.78 | 6,712,586.62 |
| OD පොළිය | 2,718,708.65 | 3,278,089.57 |
| බැංකු මුදල් සහ කොමිස් | - | 278,089.86 |
| | **5,070,580.43** | **10,727,241.55** |

**සටහන 11 - මූල්‍ය ආදායම**

| | | |
|---|---|---|
| පොලී ආදායම | 325,712.52 | 97,446.87 |
| | **325,712.52** | **97,446.87** |

**සටහන 12 - ආදායම් බදු වියදම්**

| | | |
|---|---|---|
| බදු අය කල හැකි ආදායම් මත පැනවෙන බදු | 11,064,150.46 | 379,468.28 |
| විස්තෘතික ලාභාංශ මත පැනවෙන බදු | - | - |
| | **11,064,150.46** | **379,468.28** |

**සමස්ථ ආදායම් ප්‍රකාශනය පිළිබඳව වන සටහන්.**

**දෙසැම්බර් 31 අවසන් වන වර්ෂය සඳහා.**

**සටහන 13 -දේපළ සහ යන්ත්‍රෝපකරණ**
**පිරිවැය/ප්‍රතිතක්සේරුකරණය**

| | | | | |
|---|---|---|---|---|
| **සින්නක්කරවත්කම්** | | | | |
| ඉඩම් | 250,000,000.00 | - | - | 250,000,000.00 |
| ගොඩනැගිලි | 17,500,000.00 | - | - | 17,500,000.00 |
| යන්ත්‍රෝපකරණ | 3,145,000.00 | 41,964,912.00 | - | 45,109,912.00 |
| කර්මාන්තශාලා උපකරණ | 2,653,571.75 | - | - | 2,253,571.75 |
| කාර්යාලීය උපකරණ | 1,688,493.49 | 910,471.95 | - | 2,598,965.44 |
| පරිගණක | 1,770,145.00 | 780,673.00 | - | 2,550,818.00 |
| ගෘහභාණ්ඩ සහ උපකරණ | 2,269,933.75 | 338,636.61 | - | 2,608,570.36 |
| උපකරණ සහ මෙවලම් | 34,267,141.62 | 643,000.00 | - | 34,910,141.62 |
| පරිගණක මෘදුකාංග | 264,500.00 | 125,000.00 | - | 389,500.00 |
| ට්‍රැක්ටර් සහ ටේල් | 2,790,000.00 | - | - | 2,790,000.00 |
| බෝට්ටු අච්චු/ධීවර යාත්‍රා | 9,650,948.51 | - | - | 9,650,948.51 |
| මෝටර් රථ | 15,546,100.00 | - | - | 15,546,100.00 |
| කල්බදු හිමි දේපල | 1,227,678.57 | 6,871,429.00 | - | 8,099,107.57 |
| මෝටර් රථ | 1,300,000.00 | - | - | 1,300,000.00 |
| ට්‍රැක්ටර් සහ ට්‍රේලර | **344,073,512.69** | **51,634,122.56** | - | **395,707,635.25** |
| **ක්ෂය** | | | | |
| **සින්ක්කර වත්කම්** | | | | |
| ගොඩනැගිලි | 4,374,999.70 | 874,999.93 | - | 5,249,999.63 |
| යන්ත්‍රෝපකරණ | 131,041.65 | 1,095,786.50 | - | 1,226,828.15 |
| කර්මාන්තශාලා උපකරණ | 1,544,051.43 | 339,196.56 | - | 1,883,247.99 |
| කාර්යාලීය උපකරණ | 1,138,631.92 | 378,731.71 | - | 1,517,587.63 |
| පරිගණක | 1,233,631.29 | 381,162.62 | | 1,614,793.91 |
| පරිගණ මෘදුකාංග | 260,091.78 | 6,250.00 | - | 266,341.78 |
| උපකරණ සහ මෙවලම් | 6,375.009.64 | 6,959,071.69 | - | 13,334,081.33 |
| ගෘහභාණ්ඩ සහ උපකරණ | 2,078,938,85 | 179,314.74 | - | 2,258,253.59 |
| බෝට්ටු අච්චු | 3,810,011.51 | 1,657,383.02 | - | 5,467,394.53 |
| ට්‍රැක්ටර් සහ ට්‍රේලර් | 869,453.35 | 624,999.96 | - | 1,494,543.31 |
| මෝටර් රථ | 10,891,454.42 | 1,767,542.57 | - | 12,658,996,99 |
| **කල්බදු හිමි දේපල** | | | | |
| මෝටර් රථ | 562,686.01 | 450,074.41 | - | 1,012,760.42 |
| ට්‍රැක්ටර් සහ ට්‍රේලර් | 1,299,999.96 | - | - | 1,299,999.96 |
| | **34,570,225.51** | **14,714,513.71** | - | **49,284,739.22** |
| ශුද්ධ පොත් ගත වටිනාකම | **309,503,287.18** | | | **346,422,896.03** |

**සමස්ථ ආදායම් ප්‍රකාශනය පිළිබඳව වන සටහන්.**

**දෙසැම්බර් 31 අවසන් වන වර්ෂය සඳහා.**

**සටහන 14 - භාණ්ඩ ලේඛන.**

| | | |
|---|---|---|
| තොග වශයෙන් ඇති අමුද්‍රව්‍ය | 6,067.617.91 | 11,241,424.65 |
| මුලද්‍රව්‍ය කටයුතු | 3,837,716.39 | 19,444,218.51 |
| තොග වශයෙන් ඇති ධීවර යාත්‍රා | 6,176,031.29 | 4,379,958.16 |
| තොග වශයෙන් ඇති FG දැල් සහ ධීවර ආම්පන්න | 31,207,221.04 | 30,664,740.77 |
| | **47,288,586.63** | 65,730,342.09 |

**සටහන 15 - වෙළඳ ලැබීම්.**

| | | |
|---|---|---|
| වෙළඳ ණයකරුවන් | 327,291,528.90 | 58,200,857.85 |
| අඩු කරන ලද : බොල් ණය සඳහා ප්‍රතිපාදන | (6,392,490.12) | (6,392,490.12) |
| | **320,899,038.78** | 51,898,367.73 |

**සටහන 16 -කාර්යය මණ්ඩලයේ ණය කරුවන්.**

| | | |
|---|---|---|
| උත්සව අත්තිකාරම් | 90,100.00 | 105,100.00 |
| පොත් ගත ණය | - | 30,000.00 |
| සේවකයින් සඳහා ලබා දුන් දුරකථන | - | 7,500.00 |
| කාර්යය මණ්ඩලයේ ණය කරුවන් | 4,549,590.02 | 1,530,999.47 |
| | **4,639,690.02** | 1,673,599.47 |

**සටහන 17 - වෙනත් ලැබීම්.**

| | | |
|---|---|---|
| අත්තිකාරම් ලබා දීම අමුද්‍රව්‍ය | 115,462.59 | 1,571,133.96 |
| අත්තිකාරම් ලබා දීම වෙනත් | 31,985,311.54 | 4,137,784.29 |
| පෙරගෙවුම් LC ගාස්තු | - | 2,845,571.27 |
| වෙනත් ලැබීම් A/C | 1,877,662.37 | 2,007,097.75 |
| පෙරගෙවුම් ESC බදු | 2,466,894.26 | 841,388.02 |
| උප කොන්ත්‍රාත් | 4,909,775.05 | 4,909,775.05 |
| නැවත ගෙවිය හැකි තැම්පතු | 521,500.00 | 539,000.00 |
| දික්ඕවිට ව්‍යාපෘතිය පවත්වාගෙන යාම | 4,429,435.11 | 5,909,685.09 |
| මරදාන පැකේජය 01 පවත්වාගෙන යාම | 4,797,851.50 | - |
| දික්ඕවිට L/S පවත්වාගෙන යාම | 3,514,115.00 | - |
| අත්හිටුවන බදු | 1,119,029.73 | 1,119,029.73 |
| සීනෝ(ර්) ආපනශාලා ලැබීම් | 542,877.16 | 542,877.16 |
| තීරණයක් ලැබී නොමැති නඩු තීන්දු | 14,902,63 | - |
| බැංකු ඇප | - | 2,351,825.00 |
| නැංගුරම්පල ව්‍යාපෘතිය A/C | (84,814.30) | (395,327.00) |
| දික්ඕවිට ව්‍යාපෘතිය A/C | (1,328,081.03) | - |
| | **54,881,921.61** | **26,379,838.32** |

**සමස්ථ ආදායම් ප්‍රකාශනය පිළිබඳව වන සටහන්.**

**දෙසැම්බර් 31 අවසන් වන වර්ෂය සඳහා.**

**සටහන 18 - මුදල් සහ බැංකු.**

| | | |
|---|---|---|
| මහජන බැංකුව ක්වීන් ශාඛාව | - | 322,135.76 |
| හැටන් නැෂනල් බැංකුව | 113,108.69 | 146,020.44 |
| හැටන් නැෂනල් බැංකුව | 26,823.58 | 26,823.58 |
| පෑන්ඒෂියා බැංකුව | 2,941.80 | 2,941.80 |
| සුළු මුදල් අග්‍රිම A/C | 187,000.00 | 160,000.00 |
| ලංකා බැංකුව | 1,262,376.02 | - |
| ප්‍රති ප්‍රවේශ | - | 3.60 |
| ඉන්ධන අග්‍රිම | 116,000.00 | 95,000.00 |
| | **1,708,250.09** | **752,925.18** |

**ජංගම නොවන බැරකම්**

**සටහන 19 -අමාත්‍යංශ ප්‍රතිපාදන.**

| | | |
|---|---|---|
| බෝට්ටු අච්චු අත්තිකාරම් අඩි 55 දිග | 20,000,000.00 | 20,000,000.00 |
| අඩු කරන ලද : විලම්භනය කල අඩි 55 | (17,921,607.60) | (17,921,607.60) |
| දිගැති බෝට්ටු අච්චු | **2,078,392.40** | **2,078,392.40** |

**සටහන 20 - වෙනත් විලම්භනය නොකල බැරකම්.**

| | | |
|---|---|---|
| වර්ෂය ආරම්භයේදී ශේෂය | 11,957,375.00 | 11,789,618.00 |
| එකතු කරන ලද වර්ෂය සඳහා ප්‍රතිපාදන | 338,206.50 | 168,551.00 |
| පරිතෝෂිකය DIR | 1,565,929.10 | 1,490,633.64 |
| පරිතෝෂිකය ADM | 13,861,510.60 | 13,448,802.64 |
| | (3,008,960.10) | (1,491,427.64) |
| අඩු කරන ලද වර්ෂය තුළදී ගෙවීම් | 10,852,550.50 | 11,957,375.00 |
| පරිතෝෂික ප්‍රතිපාදන A/C | 22,834,572.51 | 32,467,785.73 |
| විලම්භිත ආදායම | **33,687,123.01** | **44,425,160.73** |

**සටහන 21 - ණය ගැනීම මත පොළිය.**

| | | |
|---|---|---|
| කල්බදු ණය හිමියන් | 5,593,400.00 | 464,254.00 |
| ණය අඩු කරන ලද විලම්භිත පොළිය | (1,112,591.11) | (29,369.24) |
| | **5,480,808.89** | **434,884.76** |

**සමස්ථ ආදායම් ප්‍රකාශනය පිළිබඳව වන සටහන්.**

**දෙසැම්බර් 31 අවසන් වන වර්ෂය සඳහා.**

**ජංගම බැරකම්**

| | | |
|---|---|---|
| සටහන 22 කල්බදු ණය හිමියන්. | | |
| කල්බදු ණය හිමියන් | 2,100.650.16 | 397,932.00 |
| අඩු කරන ලද විලම්භිත පොලිය | (624,346.00) | (75,520.89) |
| | **1,476,304.17** | **322,411.11** |
| සටහන 23 වෙළඳ ණය හිමියන්. | 168,683.199.19 | 49,603,067.45 |
| | **168,683,199.19** | **49,603,067.45** |
| **සටහන 24 - වෙනත් ගෙවීම්.** | | |
| එකතු වූ වියදම් | - | 3,016,546.47 |
| සේවක අර්ථසාධක | 498,310.93 | 426,701.97 |
| සේවක භාරකාර අරමුදල් | 71,340.60 | 64,005.28 |
| G.S.T | 650,625.86 | 650,625.86 |
| තැම්පතු | 2,306,000.00 | 2,346,840.00 |
| මුද්දර තීරුබදු | 6,500.00 | 5,325.00 |
| N.S.L. A/C | 1,691,290.75 | 1,691,290.75 |
| ආරක්ෂණ | 1,144,306.45 | 1,144,306.45 |
| W.H.T | 3,368,451.75 | 3,368,451.75 |
| පිරිවැටුම් බදු | 243,597.89 | 243,597.89 |
| එකතු කළ අගය මත බදු | 1,458,292.91 | 1,458,292.91 |
| එකතු කළ අගය මත බදු | 18,214,723.44 | 26,726,055.04 |
| N.B.T. | 12,099,200.56 | 1,370,503.95 |
| බැංකු ණය | 130,126.32 | (3,900.00) |
| විකුණුම් අත්තිකාරම් | 162,380,382.50 | 30,648,646.25 |
| අත්තිකාරම් රිසිට්පත | - | 131,764.71 |
| | 2,892,913.56 | 2,986,093.18 |
| නෝර්ත් සී සඳහා වූ ධාරිත | - | 1,379,837.56 |
| සුභසාධක සංගමය | 88,325.74 | 64,622.74 |
| වෘත්තීය සමිති A/C | 6,375.00 | 1,600.00 |
| සුභසාධක අරමුදල | 172,821.50 | 159,281.50 |
| සේවයෙහි යෙදවීමේ අත්තිකාරම් දික්ඕවිට | 128,364.38 | 1,628,495.30 |
| සේවයේ යෙදවීමේ අත්තිකාරම් මරදාන | 30,411,772.00 | - |
| වැටුප් පාලනය A/C | 2,764,939.58 | 2,075,580.98 |
| විලම්භිත පොලිය කාර්යය මණ්ඩල ණය | 244,148.93 | - |
| හිමිකම් නොකී වැටුප් සහ වේතන | 153,009.82 | 138,930.56 |
| ආදායම A/C | (6,988.90) | (4,429.90) |
| වෙනත් ණය කරුවන් | 68,479.68 | 68,479.68 |
| විගණකවරුන් සඳහා ගෙවීම් | 110,000.00 | 110,000.00 |
| | **241,297,311.25** | **81,897,545.88** |

**සමස්ථ ආදායම් ප්‍රකාශනය පිළිබඳව වන සටහන්.**

**දෙසැම්බර් 31 අවසන් වන වර්ෂය සඳහා.**

**සටහන 25 - ආදායම් බදු ගෙවීම්.**

| | | |
|---|---|---|
| ජනවාරි 01 දිනට ශේෂය | - | 2,546,806.64 |
| වර්ෂය සඳහා ආදායම් බදු | 11,064,150.00 | 379,468.28 |
| | 11,064,150.46 | 2,926,274.92 |
| අඩු කරන ලද : E.S.C වෙනුවට හිලව් කරන ලද බදු | - | (2,546,806.64) |
| අඩු කරන ලද : ගෙවන ලද E.S.C | | |
| 2009/10 | - | (2,004,975.00) |
| 2010/11 | (2,404,943.00) | (2,404,943.00) |
| 2011/12 | (810,327.00) | (810,327.00) |
| 2012/13 | (338,333.00) | (338,333.00) |
| 2013/14 | (210,421.00) | (210,420.52) |
| 2014/15 | - | - |
| ගෙවිය හැකි ආදායම් බදු | **7,300,126.46** | **(5,389,530.24)** |

**සටහන 26 -කෙටි කාලීන ණය**

| | | |
|---|---|---|
| කෙටි කාලීන ණය A/C | 10,633,248.04 | 44,875,733.34 |
| ණය කාල සීමාව ලංකා බැංකුව | - | 18,333.332.00 |
| | **10,633,248.04** | **63,209,065.34** |

**සටහන 27 - බැංකු අයිරා**

| | | |
|---|---|---|
| ලංකා බැංකුව | - | 685,567.48 |
| මහජන බැංකුව ක්වීන් ශාඛාව | 373,543.80 | - |
| ලංකා බැංකුව කොළඹ ශාඛාව | 1,593,400.51 | 35,491,718.03 |
| ප්‍රති සටහන් | 29.68 | - |
| | **1,966,973.99** | **36,177,285.51** |

**සටහන 28 -ආයෝජන දේපල ආයෝජනයෙන් ලබූ ආදායම.**

දේපල / ආයෝජන / මැනිම සඳහා සමාගම විසින් පිරිවැය ආකෘතිය බෙදාගනු ලැබ ඇත. ආයෝජන වත්කම් මැනීම සඳහා සමාගම පිරිවැයේ ආදර්ශ භාවිතා කර ඇත. පහත දක්වා ඇති පරිදි 2014 වර්ෂය සඳහා ආයෝජන වත්කම් වලින් ලැබෙන විශ්වාසනීය කුලිය ආදායම් සඳහා විකල්පයක් නොමැති හෙයින් (FAIR Value) සාධාරණ අගය විශ්වාසනීය ලෙස නිර්ණය කිරීමට නොහැකි විය. සාධාරණ අගය සඳහා සමාගම පිරිවැය ක්‍රමය භාවිතා කරන ලදී.

| ස්ථානය / භාණ්ඩය | රු. ශත. |
|---|---|
| **ජංගම වැඩහල් 4ක්** | 1,170,392.15 |
| **මට්ටක්කුළියේ පිහිටි ඉඩම** | 2,869,882.36 |
| **ඩී. ආර්. විජේවර්ධන කර්යාලය සතු ඉඩම** | 4,500,000.00 |
| **ඩී. ආර්. විජේවර්ධන මාවතේ පිහිටි ඉඩම** | 1,170,000.00 |
| **මත්තුමගල පිහිටි ඉඩම** | 1,800,000.00 |
| **මුළු එකතුව** | **11,510,274.51** |

**සීමා සහිත සී-නෝ(ර්) පදනම වෙත යවන ලද විගණකවරුන්ගේ කළමණාකරණ ලිපිය පිළිබඳ අදහස් දැක්වීම්.**

**2014 දෙසැම්බර් 31 වන දිනට අවසන් වන වර්ෂය සඳහා වන සීමාසහිත සී-නෝ(ර්) පදනමෙහි විගණන වාර්ථාව.**

අදාල වර්ෂයේ විගණන කටයුතු සංශෝදනයෙන් ඔබ විසින් සිදු කරන ලද නිරීක්ෂණ අප කළමණාකාරීත්වය මගින් සමාජලෝචනය කරන ලද අතර, ඒ පිළිබඳ අපගේ අදහස් පහත පරිදි වේ.

**01. පරිපාලන වියදම් ඉහළ යාම**

**i.** සාමූහික සමාජ වගකීම් කටයුතු වලට මැදිහත් වෙමින් ආයතනයේ සාමූහික බව ඉහල නැංවීමේ අරමුණ සහිතව කළමණාකාරීත්වය මගින් මෙම වියදම් දැරීම සිදු කරන ලදි. මෙවැනි වියදම් ඉදිරියේදීසිදු කරන විට ව්‍යාපාරික අරමුණු වලට සරිලන වියදම් සඳහා වඩා වැඩි නැඹුරුතාවක් ලබා දීමට සමාගම කටයුතු කරනු ඇත.

**ii.** අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා යමින් බඳවා ගන්නා ලද සියළුම සේවකයන් කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන ඇත. දැනටමත් සඳහන් කර ඇති පරිදි සමාගම ක්‍රමයෙන් වර්ධනය වන විට සහ ධීවර කර්මාන්තය තුළ විවිධ ව්‍යාපාරික කාර්යයන් හී වියැලෙන විට හමුවන විවිධ අභියෝග වලට මුහුණ දීමට සහ අනෙකුත් අවශ්‍යතා සඳහා කුසලතා පිරි නිළධාරීන් බඳවා ගැනීම අත්‍යවශ්‍ය වේ. එම නිසා රාජ්‍ය අංශයේ අනුමත වැටුප් පරිමාන වලට අනුව එවැනි නිළධාරීන් බඳවා ගැනීම තරමක් අසීරු වේ. තවද මෙම බඳවා ගැනීම් සඳහා අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතියද ලබාගෙන ඇත.

**iii.** අවශ්‍යතාවලට සරිලන පරිදි වැටුප් පරිමාණ වෙනස් කිරීමට අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම සඳහා ද අපි කටයුතු කරමින් සිටිමු.

**iv.** 2014 වර්ෂය තුලදී මිලියන 1266 ක් පමණ වටිනා මාළු දැල් සහ ජීවිත ආරක්ෂක කබා ඇනවුමක් ධීවර අමාත්‍යංශයෙන් අප වෙත ලැබුණි. බදු ගෙවී 2014 වර්ෂය සඳහා වන බදු මුදල් පියවීමෙන් පසු රුපියල් මිලියන 89 ක ප්‍රතිලාභයක් ලබා ගැනීමට මෙමගින් හැකි වූ අතර, මෙය සමාගමේ උපාය මාර්ගයක දිශාව වෙනස් කර ගැනීමට මහෝපකාරීවිය. අප රජය සතු සමාගමක් වන නිසාත් මුළු ආදායමෙන් සැලකිය යුතු ප්‍රමාණයක් උපයා ගැනීමට ධීවර අමාත්‍යංශය සහ වෙනත් විවිධ රජයේ ආයතන ධායක වන හෙයින් අපගේ ආදායම් අරමුණු කර ගැනීම සඳහා මෙම ආයතන බෙදුමෙන් ආකර්ෂණය කර ගරුනීමට සහ රැකගැනීමට මෙම වියදම් වෙළඳ පොළ උපක්‍රමයක් ලෙස කළමණාකාරීත්වය මගින් සිදු කොට ඇත.

**02. ව්‍යවස්ථාපිත විධිවිධාන වලට අනුකූල නොවීම.**

M/S Orient Pearl Hotels සමාගම සමඟ මේ සංශෝධනයෙන් 1998 ඇති කර ගත් ගිවිසුම 2018 අවසන් වීමට නියමිතව ඇත. මෙම ගිවිසුම අනුව සෑම අවුරුදු 05 ට වරක්ම 50% කින් බදු කුලිය වැඩි කල හැක. එහි ප්‍රතිඵලයක් ලෙස රු.135.000/ ක (VAT රහිතව) මුදලක් අපට ලබා ගත හැකි අතර වසරකට ඔවුන්ගේ ආදායමෙන් 40% ට හිමිකම් පෑමටද හැකිය. 2018 වර්ෂය තෙක් නීත්‍යානුකූලව ගිවිසුම් ගතව ඇති හෙයින් ඊට පෙර මෙම ගිවිසුම අවසන් කිරීමට හැකිවේද යන්න නීත්‍යානුකූල මාර්ගයෙන් ඉදිරියේදී උපදෙස් ගනු ඇත. එසේ වුවහොත් මීට වඩා ආදායමක් සහිත ව්‍යාපෘතියක් සඳහා මෙම භූමිය ආයෝජනය කිරීමට හැකිවනු ඇත.

තවද අනාවරණය කරන ලද අවශ්‍යතා ශ්‍රී ලංකා විගණන ප්‍රමිති LKAS 40 අනුව සපුරා ඇත. ඔබ ලිපිය මඟින් සිදු කරන ලද විමසීම් සම්බන්ධයෙන් අපගේ සැලකිලි කිරීම් ඉහත දක්වා ඇත.

ඉංජිනේරු බී.පී. සරත් කුමාර ද සිල්වා
අත්සන් කොට ඇත.

සභාපති සීමාසහිත සීනෝ(ර්) පදනම.